## අ.පො.ස (සා.පෙළ) විභාගය - 2013

# ඇගයීම් වාර්තාව

# 62 - පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව.

# අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2013

# ඇගයීම් වාර්තාව

# 62 - පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

**පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය**

ඇගයීම් වාර්තාව - අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2013

මූල්‍ය අනුග්‍රහය

අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB) මගිනි.

# හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ විභාග අතුරින් වැඩි ම අයදුම්කරුවන් සංඛ්‍යාවක් පෙනී සිටින්නේ අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහා ය. ජාතික මට්ටමින් පැවැත්වෙන මෙම විභාගයේ ප්‍රතිඵල මත නිකුත් කෙරෙන සහතිකය, උසස් අධ්‍යාපනය සඳහා සුදුස්සන් තෝරා ගැනීමට පමණක් නොව මධ්‍යම මට්ටමේ රැකියා අවස්ථා ලබාගැනීමට ද ජාතික හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල සමහර පාඨමාලා හැදෑරීමට මූලික සුදුසුකමක් ලෙස සැලකෙන මිනුම් දණ්ඩක් වශයෙන් ද පිළිගැනේ. මෙලෙස පිළිගැනෙන්නේ මෙම විභාගයේ ඇති වලංගුතාව හා විශ්වසනීයතාව මෙන් ම ඉහළ ගුණාත්මක බව ද හේතුවෙනි.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද දැඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහාය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු නොඅනුමාන ය. මේ නිසා මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා පුස්තකාලයට යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව කොටස් තුනකින් යුක්ත වන අතර විෂය අභිමතාර්ථ සහ විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද මෙම විෂයයෙහි ප්‍රශ්න පත්‍ර ඇසුරෙන් අයදුම්කරුවන්ගේ සාධනය, එක් එක් ප්‍රශ්නය සඳහා වෙන් වෙන්ව ද මෙහි I කොටසෙහි ඇතුළත් වේ. ඇගයීම් හා පරීක්ෂණ ක්ෂේත්‍රයේ භාවිත වන සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) සහ අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) පදනම් කරගෙන, විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මඟින් මෙම විශ්ලේෂණ සිදුකර ඇත.

පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය විෂයයෙහි I හා II ප්‍රශ්න පත්‍ර සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටි, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා ප්‍රතිපෝෂණය සඳහා වූ යෝජනාවලින් මෙම වාර්තාවෙහි II කොටස සමන්විත වේ.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

මෙම වාර්තාවේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස ඉල්ලමි. මෙම වාර්තාව සකස් කිරීම සඳහා කැප වූ පාලක පරීක්ෂකවරුන් ඇතුළු සම්පත් දායකයින්ටත් RD ආකෘති මඟින් තොරතුරු සැපයූ ප්‍රධාන/ අතිරේක ප්‍රධාන/ සහකාර පරීක්ෂකවරුන්ටත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු ම දෙනාටත් මාගේ හෘදයංගම ස්තුතිය පළ කරමි.

ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර
විභාග කොමසාරිස් ජනරාල්

2015 පෙබරවාරි 24

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

| | | |
|---|---|---|
| **උපදේශකත්වය** | : | ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර<br>විභාග කොමසාරිස් ජනරාල් |
| **මෙහෙයවීම හා සංවිධානය** | : | ගයාත්‍රි අබේගුණසේකර<br>විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| **සම්බන්ධීකරණය** | : | එච්.එම්.දිසානායක<br>සහකාර විභාග කොමසාරිස් |
| **සංස්කරණය** | : | ඒ.ඒ. නීලියා උපසේන<br>ශ්‍රී ලංකා ගුරු සේවය I<br>බප/ හෝ/ ජල්තර මහා විද්‍යාලය<br>හංවැල්ල |
| **සැකසුම් කමිටුව** | : | චිත්‍රා අබේසිංහ<br>ගුරු උපදේශක<br>කලාප අධ්‍යාපන කාර්යාලය<br>ඇල්පිටිය<br><br>එස්. ජයන්ති ඉන්ද්‍රවතී<br>ශ්‍රී ලංකා ගුරු සේවය I<br>කෑ/ මාව/ සුජාතා විදුහල<br>රඹුක්කන<br><br>ඒ.ඒ.සී. දමයන්ති අධිකාරි<br>ශ්‍රී ලංකා ගුරු සේවය I<br>ගම්/ රත්නාවලී බාලිකා විද්‍යාලය<br>ගම්පහ.<br><br>ඒ.ජී. ජයතිලක<br>ශ්‍රී ලංකා ගුරු සේවය I<br>මප/වත්/ දොරගමුව මහා විද්‍යාලය<br>දොරගමුව |
| **පරිගණක පිටපත සැකසුම** | : | කේ.ඒ.ඩී. තිලානි ලක්මාලි<br>රාජ්‍ය කළමනාකරණ සේවය III<br><br>ටී.දර්ශිකා නිලූපුලී<br>දත්ත සටහන් ක්‍රියාකරු |

# ඇතුළත පිටු

පිටු අංකය

## I කොටස



## II කොටස



## III කොටස

# I කොටස

## 1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.1. විෂය අභිමතාර්ථ

ශ්‍රී ලංකාව සුවිශේෂී ලෙසින් අරමුණු කරගෙන යහ පාලනයේ හා ආර්ථික කටයුතුවල මූලධර්ම හා ප්‍රායෝගික තලය සිසුනට අවබෝධ වන ආකාරයෙන් මෙම විෂය නිර්දේශය සකස් වී ඇත. මෙමගින් ඔවුන් ප්‍රජාතන්ත්‍රවාදී හා වගකිව යුතු ව්‍යුහයන්හි හා ජීවන රටාවන්හි වැදගත්කම අගය කරමින් සමාජ පරිසරය තුළ මිනිසාගේ ඵලදායි සංවර්ධනයට දායක විය යුතු බව අවධාරණය වී ඇත.

## 1.2. විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.2.1. විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

| මාධ්‍යය | පාසල් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 88919 | 2385 | 91304 |
| දෙමළ | 17951 | 2968 | 20919 |
| ඉංග්‍රීසි | 437 | 164 | 601 |
| එකතුව | **107307** | **5517** | **112824** |

වගුව 1

### 1.2.2. අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පාසල් අයදුම්කරුවන් | | පෞද්ගලික අයදුම්කරුවන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 14175 | 13.21 | 150 | 2.72 | 14325 | 12.70 |
| B | 13784 | 12.85 | 395 | 7.16 | 14179 | 12.57 |
| C | 30488 | 28.41 | 1534 | 27.80 | 32022 | 28.38 |
| S | 31413 | 29.27 | 2324 | 42.12 | 33737 | 29.90 |
| W | 17447 | 16.26 | 1114 | 20.19 | 18561 | 16.45 |
| එකතුව | **107307** | **100** | **5517** | **99.99** | **112824** | **100** |

වගුව 2

## 1.2.3. පළමු වතාවට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 6427 | 764 | 11.89 | 690 | 10.74 | 1572 | 24.46 | 1990 | 30.96 | 5016 | 78.05 | 1411 | 21.95 |
| 2. ගම්පහ | 7700 | 928 | 12.05 | 915 | 11.88 | 2048 | 26.60 | 2257 | 29.31 | 6148 | 79.84 | 1552 | 20.16 |
| 3. කළුතර | 5126 | 900 | 17.56 | 708 | 13.81 | 1322 | 25.79 | 1326 | 25.87 | 4256 | 83.83 | 870 | 16.97 |
| 4. මහනුවර | 6405 | 1175 | 18.35 | 913 | 14.25 | 1772 | 27.67 | 1620 | 25.29 | 5480 | 85.56 | 925 | 14.44 |
| 5. මාතලේ | 2468 | 327 | 13.25 | 339 | 13.74 | 603 | 24.43 | 690 | 27.96 | 1959 | 79.38 | 509 | 20.62 |
| 6. නුවරඑළිය | 3492 | 324 | 9.28 | 417 | 61.36 | 1018 | 29.15 | 1071 | 30.67 | 2830 | 81.04 | 662 | 18.96 |
| 7. ගාල්ල | 5275 | 615 | 11.80 | 617 | 11.84 | 1332 | 25.56 | 1572 | 30.17 | 4136 | 79.37 | 1075 | 20.63 |
| 8. මාතර | 4827 | 762 | 19.73 | 576 | 14.91 | 1129 | 29.23 | 904 | 23.40 | 3371 | 87.26 | 492 | 12.74 |
| 9. හම්බන්තොට | 2990 | 831 | 20.68 | 623 | 15.51 | 1162 | 28.92 | 917 | 22.82 | 3533 | 87.93 | 485 | 12.07 |
| 10. යාපනය | 3236 | 227 | 7.01 | 320 | 9.89 | 872 | 26.95 | 1056 | 32.63 | 2475 | 76.48 | 761 | 23.52 |
| 11. කිලිනොච්චි | 708 | 42 | 5.93 | 59 | 8.33 | 187 | 26.41 | 249 | 35.17 | 537 | 75.85 | 171 | 24.15 |
| 12. මන්නාරම | 460 | 16 | 3.48 | 51 | 11.09 | 161 | 35.00 | 171 | 37.17 | 399 | 86.74 | 61 | 13.26 |
| 13. වව්නියාව | 676 | 71 | 10.50 | 118 | 17.46 | 197 | 29.14 | 208 | 30.77 | 594 | 87.87 | 82 | 12.13 |
| 14. මුලතිව් | 445 | 15 | 3.37 | 43 | 9.66 | 107 | 24.04 | 161 | 36.18 | 326 | 73.26 | 119 | 26.74 |
| 15. මඩකලපුව | 4085 | 510 | 12.48 | 581 | 14.22 | 1240 | 30.35 | 1158 | 28.35 | 3489 | 85.41 | 596 | 14.59 |
| 16. අම්පාර | 4538 | 914 | 20.14 | 798 | 17.58 | 1300 | 28.65 | 1107 | 24.39 | 4119 | 90.77 | 419 | 9.23 |
| 17. ත්‍රිකුණාමලය | 1022 | 173 | 16.93 | 172 | 16.83 | 298 | 29.16 | 262 | 25.64 | 905 | 88.55 | 117 | 11.45 |
| 18. කුරුණෑගල | 8729 | 1447 | 16.58 | 1255 | 14.38 | 2591 | 29.68 | 2238 | 25.64 | 7531 | 86.28 | 1198 | 13.72 |
| 19. පුත්තලම | 3418 | 339 | 9.92 | 370 | 10.83 | 930 | 27.21 | 1096 | 32.07 | 2735 | 80.02 | 683 | 19.98 |
| 20. අනුරාධපුරය | 5012 | 654 | 13.05 | 700 | 13.97 | 1398 | 27.89 | 1407 | 28.07 | 4159 | 82.98 | 853 | 17.02 |
| 21. පොළොන්නරුව | 1997 | 262 | 13.12 | 274 | 13.72 | 531 | 26.59 | 564 | 28.24 | 1631 | 81.67 | 366 | 18.33 |
| 22. බදුල්ල | 5065 | 768 | 15.16 | 727 | 14.35 | 1560 | 30.80 | 1279 | 25.25 | 4334 | 85.57 | 731 | 14.43 |
| 23. මොනරාගල | 3160 | 418 | 13.23 | 445 | 14.08 | 869 | 27.50 | 843 | 26.68 | 2575 | 81.49 | 585 | 18.51 |
| 24. රත්නපුරය | 5638 | 952 | 16.89 | 827 | 14.67 | 1611 | 28.57 | 1450 | 25.72 | 4840 | 85.85 | 798 | 14.15 |
| 25. කෑගල්ල | 3606 | 575 | 15.95 | 493 | 13.67 | 1035 | 28.70 | 975 | 27.04 | 3078 | 85.36 | 528 | 14.64 |
| **සමස්ත දිවයින** | **96505** | **14009** | **14.52** | **13031** | **13.50** | **26845** | **27.82** | **26571** | **27.53** | **80456** | **83.37** | **16049** | **16.63** |

වගුව 3

## 1.2.4. පළමු වතාවට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 1753 | 329 | 18.77 | 198 | 11.29 | 400 | 22.82 | 477 | 27.21 | 1404 | 80.09 | 349 | 19.91 |
| 2. හෝමාගම | 1186 | 81 | 6.83 | 111 | 9.36 | 253 | 21.33 | 374 | 31.53 | 819 | 69.06 | 367 | 30.94 |
| 3. ශ්‍රී ජයවර්ධනපුර | 2184 | 271 | 12.41 | 257 | 11.77 | 598 | 27.38 | 680 | 31.14 | 1806 | 82.69 | 378 | 17.31 |
| 4. පිළියන්දල | 1304 | 83 | 6.37 | 124 | 9.51 | 321 | 24.62 | 459 | 35.20 | 987 | 75.69 | 317 | 24.31 |
| 5. ගම්පහ | 2136 | 339 | 15.87 | 267 | 12.50 | 554 | 25.94 | 550 | 25.75 | 1710 | 80.06 | 426 | 19.94 |
| 6 මිනුවන්ගොඩ | 1672 | 212 | 12.68 | 206 | 12.32 | 456 | 27.27 | 512 | 30.62 | 1386 | 82.89 | 286 | 17.11 |
| 7. මීගමුව | 1828 | 150 | 8.21 | 171 | 9.35 | 484 | 26.48 | 586 | 32.06 | 1391 | 76.09 | 437 | 23.91 |
| 8. කැලණිය | 2064 | 227 | 11.00 | 271 | 13.13 | 554 | 26.84 | 609 | 29.51 | 1661 | 80.47 | 403 | 19.53 |
| 9. කළුතර | 1650 | 170 | 10.30 | 176 | 10.67 | 420 | 25.45 | 480 | 29.09 | 1246 | 75.52 | 404 | 24.48 |
| 10. මතුගම | 1640 | 362 | 22.07 | 242 | 14.76 | 442 | 26.95 | 387 | 23.60 | 1433 | 87.38 | 207 | 12.62 |
| 11. හොරණ | 1836 | 368 | 20.04 | 290 | 15.80 | 460 | 25.05 | 459 | 25.00 | 1577 | 85.89 | 259 | 14.11 |
| 12. මහනුවර | 2277 | 716 | 31.44 | 354 | 15.55 | 580 | 25.47 | 426 | 18.71 | 2076 | 91.17 | 201 | 8.83 |
| 13. දෙනුවර | 607 | 62 | 10.21 | 74 | 12.19 | 169 | 27.84 | 185 | 30.48 | 490 | 80.72 | 117 | 19.28 |
| 14. ගම්පොල | 1158 | 108 | 9.33 | 123 | 10.62 | 299 | 25.82 | 375 | 32.38 | 905 | 78.15 | 253 | 21.85 |
| 15. තෙල්දෙණිය | 724 | 65 | 8.98 | 81 | 11.19 | 225 | 31.08 | 212 | 29.28 | 583 | 80.52 | 141 | 19.48 |
| 16. වත්තේගම | 717 | 97 | 13.53 | 121 | 16.88 | 225 | 31.38 | 179 | 24.97 | 622 | 86.75 | 95 | 13.25 |
| 17. කටුගස්තොට | 922 | 127 | 13.77 | 160 | 17.35 | 274 | 29.72 | 243 | 26.36 | 804 | 87.20 | 118 | 12.80 |
| 18. මාතලේ | 1013 | 183 | 18.07 | 169 | 16.68 | 245 | 24.19 | 267 | 26.36 | 864 | 85.29 | 149 | 14.71 |
| 19. ගලේවෙල | 1035 | 75 | 7.25 | 120 | 11.59 | 258 | 24.93 | 321 | 31.01 | 774 | 74.78 | 261 | 25.22 |
| 20. නාඋල | 154 | 35 | 22.73 | 23 | 14.94 | 46 | 29.87 | 38 | 24.68 | 142 | 92.21 | 12 | 7.79 |
| 21. විල්ගමුව | 266 | 34 | 12.78 | 27 | 10.15 | 54 | 20.30 | 64 | 24.06 | 179 | 67.29 | 87 | 32.71 |
| 22. නුවරඑළිය | 887 | 59 | 6.65 | 100 | 11.27 | 290 | 32.69 | 302 | 34.05 | 751 | 84.67 | 136 | 15.33 |
| 23. කොත්මලේ | 710 | 67 | 9.44 | 85 | 11.97 | 190 | 26.76 | 217 | 30.56 | 559 | 78.73 | 151 | 21.27 |
| 24. හැටන් | 809 | 62 | 7.66 | 84 | 10.38 | 230 | 28.43 | 260 | 32.14 | 636 | 78.62 | 173 | 21.38 |
| 25. වලපනේ | 451 | 57 | 12.64 | 69 | 15.30 | 137 | 30.38 | 104 | 23.06 | 367 | 81.37 | 84 | 18.63 |
| 26. හඟුරන්කෙත | 635 | 79 | 12.44 | 79 | 12.44 | 171 | 26.93 | 188 | 29.61 | 517 | 81.42 | 118 | 18.58 |
| 27. ගාල්ල | 2306 | 343 | 14.87 | 298 | 12.92 | 595 | 25.80 | 655 | 28.40 | 1891 | 82.00 | 415 | 18.00 |
| 28. ඇල්පිටිය | 1156 | 141 | 12.20 | 143 | 12.37 | 319 | 27.60 | 327 | 28.29 | 930 | 80.45 | 226 | 19.55 |
| 29. අම්බලන්ගොඩ | 899 | 57 | 6.34 | 70 | 7.79 | 197 | 21.91 | 310 | 34.48 | 634 | 70.52 | 265 | 29.48 |
| 30. උඩුගම | 914 | 82 | 8.97 | 118 | 12.91 | 241 | 26.37 | 294 | 32.17 | 735 | 80.42 | 179 | 19.58 |
| 31. මාතර | 1445 | 372 | 25.74 | 195 | 13.49 | 387 | 26.78 | 313 | 21.66 | 1267 | 87.68 | 178 | 12.32 |
| 32. අකුරැස්ස | 705 | 125 | 17.73 | 106 | 15.04 | 237 | 33.62 | 171 | 24.26 | 639 | 90.64 | 66 | 9.36 |
| 33. මුලටියන-හක්මණ | 711 | 151 | 21.24 | 134 | 18.85 | 207 | 29.11 | 137 | 19.27 | 629 | 88.47 | 82 | 11.53 |
| 34. මොරවක-දෙනියාය | 1002 | 114 | 11.38 | 141 | 14.07 | 298 | 29.74 | 283 | 28.24 | 836 | 83.43 | 166 | 16.57 |
| 35. තංගල්ල | 964 | 227 | 23.55 | 173 | 17.95 | 285 | 29.56 | 189 | 19.61 | 874 | 90.66 | 90 | 9.34 |

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 36. හම්බන්තොට | 1898 | 254 | 13.38 | 226 | 11.91 | 570 | 30.03 | 530 | 27.92 | 1580 | 83.25 | 318 | 16.75 |
| 37. වලස්මුල්ල | 1092 | 342 | 31.32 | 212 | 19.41 | 287 | 26.28 | 184 | 16.85 | 1025 | 93.86 | 67 | 6.14 |
| 38. යාපනය | 1064 | 67 | 6.30 | 110 | 10.34 | 261 | 24.53 | 365 | 34.30 | 803 | 75.47 | 261 | 24.53 |
| 39. දූපත | 259 | 6 | 2.32 | 22 | 8.49 | 61 | 23.55 | 81 | 31.27 | 170 | 65.64 | 89 | 34.36 |
| 40. තෙන්මාරච්චි | 416 | 36 | 8.65 | 44 | 10.58 | 99 | 23.80 | 132 | 31.73 | 311 | 74.76 | 105 | 25.24 |
| 41. වලිකාමන් | 1091 | 67 | 6.14 | 95 | 8.71 | 346 | 31.71 | 354 | 32.45 | 862 | 79.01 | 229 | 20.99 |
| 42. වඩමරච්චි | 406 | 51 | 12.56 | 49 | 12.07 | 105 | 25.86 | 124 | 30.54 | 329 | 81.03 | 77 | 18.97 |
| 43. කිලිනොච්චි | 708 | 42 | 5.93 | 59 | 8.33 | 187 | 26.41 | 249 | 35.17 | 537 | 75.85 | 171 | 24.15 |
| 44. මන්නාරම | 367 | 15 | 4.09 | 43 | 11.72 | 127 | 34.60 | 140 | 38.15 | 325 | 88.56 | 42 | 11.44 |
| 45. මඩු | 93 | 1 | 1.08 | 8 | 8.60 | 34 | 36.56 | 31 | 33.33 | 74 | 79.57 | 19 | 20.43 |
| 46. වව්නියාව | 475 | 61 | 12.84 | 93 | 19.58 | 143 | 30.11 | 142 | 29.89 | 439 | 92.42 | 36 | 7.58 |
| 47. වව්නියාව උතුර | 201 | 10 | 4.98 | 25 | 12.44 | 54 | 26.87 | 66 | 32.84 | 155 | 77.11 | 46 | 22.89 |
| 48. මුලතිව් | 292 | 8 | 2.74 | 23 | 7.88 | 64 | 21.92 | 111 | 38.01 | 206 | 70.55 | 86 | 29.45 |
| 49. තුනුක්කායි | 153 | 7 | 4.58 | 20 | 13.07 | 43 | 28.10 | 50 | 32.68 | 120 | 78.43 | 33 | 21.57 |
| 50. මඩකලපුව | 1329 | 185 | 13.92 | 181 | 13.62 | 381 | 28.67 | 382 | 28.74 | 1129 | 84.95 | 200 | 15.05 |
| 51. කල්කුඩා | 606 | 28 | 4.62 | 59 | 9.74 | 152 | 25.08 | 213 | 35.15 | 452 | 74.59 | 154 | 25.41 |
| 52. පදිරිප්පු | 935 | 113 | 12.09 | 129 | 13.80 | 312 | 33.37 | 264 | 28.24 | 818 | 87.49 | 117 | 12.51 |
| 53. මඩකලපුව (මධ්‍යම) | 569 | 167 | 29.35 | 149 | 26.19 | 168 | 29.53 | 79 | 13.88 | 563 | 98.95 | 6 | 1.05 |
| 54. මඩකලපුව (බටහිර) | 646 | 17 | 2.63 | 63 | 9.75 | 227 | 35.14 | 220 | 34.06 | 527 | 81.58 | 119 | 18.42 |
| 55. අම්පාර | 1146 | 283 | 24.69 | 240 | 20.94 | 292 | 25.48 | 238 | 20.77 | 1053 | 91.88 | 93 | 8.12 |
| 56. කල්මුනේ | 1448 | 385 | 26.59 | 257 | 17.75 | 415 | 28.66 | 296 | 20.44 | 1353 | 93.44 | 95 | 6.56 |
| 57. සමන්තුරෙයි | 448 | 64 | 14.29 | 50 | 11.16 | 138 | 30.80 | 140 | 31.25 | 392 | 87.50 | 56 | 12.50 |
| 58. මහඔය | 285 | 61 | 21.40 | 44 | 15.44 | 75 | 26.32 | 77 | 27.02 | 257 | 90.18 | 28 | 9.82 |
| 59. දෙහිඅත්තකන්ඩිය | 565 | 73 | 12.92 | 99 | 17.52 | 180 | 31.86 | 141 | 24.96 | 493 | 87.26 | 72 | 12.74 |
| 60. අක්කරෙයිපත්තුව | 285 | 29 | 10.18 | 63 | 22.11 | 82 | 28.77 | 92 | 32.28 | 266 | 93.33 | 19 | 6.67 |
| 61. තිරුක්කෝවිල් | 361 | 19 | 5.26 | 45 | 12.47 | 118 | 32.69 | 123 | 34.07 | 305 | 84.49 | 56 | 15.51 |
| 62. ත්‍රිකුණාමලය | 132 | 18 | 13.64 | 15 | 11.36 | 33 | 25.00 | 51 | 38.64 | 117 | 88.64 | 15 | 11.36 |
| 63. මුතූර් | 274 | 69 | 25.18 | 64 | 23.36 | 84 | 30.66 | 51 | 18.61 | 268 | 97.81 | 6 | 2.19 |
| 64. කන්තලේ | 324 | 36 | 11.11 | 46 | 14.20 | 91 | 28.09 | 95 | 29.32 | 268 | 82.72 | 56 | 17.28 |
| 65. කින්නියා | 96 | 29 | 30.21 | 25 | 26.04 | 28 | 29.17 | 13 | 13.54 | 95 | 98.96 | 1 | 1.04 |
| 66. ත්‍රිකුණාමලය (උතුර) | 196 | 21 | 10.71 | 22 | 11.22 | 62 | 31.63 | 52 | 26.53 | 157 | 80.10 | 39 | 19.90 |
| 67. කුරුණෑගල | 1986 | 396 | 19.94 | 284 | 14.30 | 558 | 28.10 | 472 | 23.77 | 1710 | 86.10 | 276 | 13.90 |
| 68. කුලියාපිටිය | 1641 | 320 | 19.5 | 225 | 13.71 | 487 | 29.68 | 424 | 25.84 | 1456 | 88.73 | 185 | 11.27 |
| 69. නිකවැරටිය | 1105 | 204 | 18.46 | 180 | 16.29 | 332 | 30.05 | 266 | 24.07 | 982 | 88.87 | 123 | 11.13 |
| 70. මහව | 1416 | 189 | 13.35 | 195 | 13.77 | 446 | 31.50 | 373 | 26.34 | 1203 | 84.96 | 213 | 15.04 |
| 71. ගිරිඋල්ල | 1526 | 169 | 11.07 | 193 | 12.65 | 443 | 29.03 | 436 | 28.57 | 1241 | 81.32 | 285 | 18.68 |
| 72. ඉබ්බාගමුව | 1055 | 169 | 16.02 | 178 | 16.87 | 325 | 30.81 | 267 | 25.31 | 939 | 89.00 | 116 | 11.00 |
| 73. පුත්තලම | 1687 | 189 | 11.20 | 187 | 11.08 | 441 | 26.14 | 516 | 30.59 | 1333 | 79.02 | 354 | 20.98 |
| 74. හලාවත | 1731 | 150 | 8.67 | 183 | 10.57 | 489 | 28.25 | 580 | 33.51 | 1402 | 80.99 | 329 | 19.01 |
| 75. අනුරාධපුරය | 1698 | 279 | 16.43 | 224 | 13.19 | 423 | 24.91 | 466 | 27.44 | 1392 | 81.98 | 306 | 18.02 |

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 76. තඹුත්තේගම | 852 | 67 | 7.86 | 116 | 13.62 | 294 | 34.51 | 240 | 28.17 | 717 | 84.15 | 135 | 15.85 |
| 77. කැකිරාව | 1021 | 124 | 12.14 | 125 | 12.24 | 285 | 27.91 | 306 | 29.97 | 840 | 82.27 | 181 | 17.73 |
| 78. ගලෙන්බිඳුනුවැව | 634 | 68 | 10.73 | 98 | 15.46 | 180 | 28.39 | 172 | 27.13 | 518 | 81.70 | 116 | 18.30 |
| 79. කැබිතිගොල්ලෑව | 807 | 116 | 14.37 | 137 | 16.98 | 216 | 26.77 | 223 | 27.63 | 692 | 85.75 | 115 | 14.25 |
| 80. පොළොන්නරුව | 520 | 67 | 12.88 | 58 | 11.15 | 141 | 27.12 | 149 | 28.65 | 415 | 79.81 | 105 | 20.19 |
| 81. හිඟුරක්ගොඩ | 816 | 100 | 12.25 | 106 | 12.99 | 224 | 27.45 | 234 | 28.68 | 664 | 81.37 | 152 | 18.63 |
| 82. දිඹුලාගල | 661 | 95 | 14.37 | 110 | 16.64 | 166 | 25.11 | 181 | 27.38 | 552 | 83.51 | 109 | 16.49 |
| 83. බදුල්ල | 1470 | 301 | 20.48 | 247 | 16.80 | 435 | 29.59 | 330 | 22.45 | 1313 | 89.32 | 157 | 10.68 |
| 84. බණ්ඩාරවෙල | 992 | 219 | 22.08 | 141 | 14.21 | 315 | 31.75 | 221 | 22.28 | 896 | 90.32 | 96 | 9.68 |
| 85. මහියංගනය | 1039 | 92 | 8.85 | 119 | 11.45 | 299 | 28.78 | 306 | 29.45 | 816 | 78.54 | 223 | 21.46 |
| 86. වැලිමඩ | 926 | 89 | 9.61 | 126 | 13.61 | 274 | 29.59 | 272 | 29.37 | 761 | 82.18 | 165 | 17.82 |
| 87. පස්සර | 638 | 67 | 10.50 | 94 | 14.73 | 237 | 37.15 | 150 | 23.51 | 548 | 85.89 | 90 | 14.11 |
| 88. මොණරාගල | 741 | 88 | 11.88 | 101 | 13.63 | 207 | 27.94 | 206 | 27.80 | 602 | 81.24 | 139 | 18.76 |
| 89. වැල්ලවාය | 1653 | 233 | 14.10 | 230 | 13.91 | 457 | 27.65 | 439 | 26.56 | 1359 | 82.21 | 294 | 17.79 |
| 90. බිබිල | 766 | 97 | 12.66 | 114 | 14.88 | 205 | 26.76 | 198 | 25.85 | 614 | 80.16 | 152 | 19.84 |
| 91. රත්නපුර | 2222 | 452 | 20.34 | 307 | 13.82 | 607 | 27.32 | 560 | 25.20 | 1926 | 86.68 | 296 | 13.32 |
| 92. බළන්ගොඩ | 915 | 134 | 14.64 | 138 | 15.08 | 245 | 26.78 | 244 | 26.67 | 761 | 83.17 | 154 | 16.83 |
| 93. නිවිතිගල | 1114 | 157 | 14.09 | 176 | 15.80 | 381 | 34.20 | 256 | 22.98 | 970 | 87.07 | 144 | 12.93 |
| 94. ඇඹිලිපිටිය | 1387 | 209 | 15.07 | 206 | 14.85 | 378 | 27.25 | 390 | 28.12 | 1183 | 85.29 | 204 | 14.71 |
| 95. කෑගල්ල | 1297 | 260 | 20.05 | 191 | 14.73 | 364 | 28.06 | 332 | 25.60 | 1147 | 88.43 | 150 | 11.57 |
| 96. මාවනැල්ල | 1136 | 169 | 14.88 | 156 | 13.73 | 316 | 27.82 | 307 | 27.02 | 948 | 83.45 | 188 | 16.55 |
| 97. දෙහිඕවිට | 1173 | 146 | 12.45 | 146 | 12.45 | 355 | 30.26 | 336 | 28.64 | 983 | 83.80 | 190 | 16.20 |
| **සමස්ත දිවයින** | **96505** | **14009** | **14.52** | **13031** | **13.50** | **26845** | **27.82** | **26571** | **27.53** | **80456** | **83.37** | **16049** | **16.63** |

වගුව 4

1.2.5. ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 876 | 0.78 | 112824 | 100.00 |
| 81 - 90 | 4552 | 4.04 | 111948 | 99.22 |
| 71 - 80 | 9926 | 8.80 | 107396 | 95.19 |
| 61 - 70 | 15329 | 13.59 | 97470 | 86.39 |
| 51 - 60 | 21986 | 19.49 | 82141 | 72.80 |
| 41 - 50 | 23518 | 20.84 | 60155 | 53.31 |
| 31 - 40 | 20106 | 17.82 | 36637 | 32.47 |
| 21 - 30 | 11964 | 10.60 | 16531 | 14.65 |
| 11 - 20 | 4339 | 3.84 | 4567 | 4.05 |
| 01 - 10 | 226 | 0.20 | 228 | 0.20 |
| 00 - 00 | 2 | 0.00 | 2 | 0.00 |

වගුව 5


ඉහත වගුවෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- {(41 - 50) පන්ති ප්‍රාන්තරය ගතහොත්}

මෙම විෂය සඳහා 41 - 50 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ගත් සංඛ්‍යාව 23518 කි. එය ප්‍රතිශතයක් ලෙස 20.84 කි. ලකුණු 50 හෝ ඊට අඩුවෙන් ලබා ඇති සංඛ්‍යාව 60155 ක් වන අතර එය ප්‍රතිශතයක් ලෙස 53.31 කි.

## 1.3. විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

### 1.3.1. I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය





ප්‍රස්තාරය 1 (RD/16/05/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත උදාහරණය පරිදි දැක්විය හැක.

උදා:- මෙම ප්‍රස්තාරයට අනුව අයදුම්කරුවන් වැඩිම සංඛ්‍යාවක් නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ 11 හා 33 ප්‍රශ්න දෙකටයි. එහි ප්‍රතිශතය 90% කි. එසේම අඩුම අයදුම්කරුවන් සංඛ්‍යාවක් නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ 27 වන ප්‍රශ්නයටයි. එහි ප්‍රතිශතය 14% කි.

### 1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය





ප්‍රස්තාරය 2 (RD/16/02/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා : මෙහි පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වුවත්, ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ 99%ක පිරිසකි. පිළිතුරු තෝරා ගැනීමේදී 7 වන ප්‍රශ්නය තෝරාගත් පිරිස 80%ක් වන අතර, 46%ක පිරිසක් 6 වන ප්‍රශ්නය තෝරා ගෙන ඇත.

### 1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය





ප්‍රස්තාරය 3 (RD/16/02/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා : මෙහි පළමුවන ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය ලකුණු 20 කි. එම ලකුණුවලින්, 76 - 100 ප්‍රාන්තරයේ එනම් ලකුණු 16 - 20 තෙක් ලබාගත් ප්‍රතිශතය 8%කි. 0 - 25% ප්‍රාන්තරයේ එනම් ලකුණු 0 - 5 තෙක් ලබාගත් ප්‍රතිශතය 17%කි.

1.3.4. **II** ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 4 (RD/16/04/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත උදාහරණයෙන් දක්වා ඇත.

උදා:- ඉහත ප්‍රස්තාරයට අනුව 5 වන ප්‍රශ්නයේ I කොටසේ පහසුතාවය 67%ක් වන අතර, 1 ප්‍රශ්නයේ iii කොටසෙහි පහසුතාව 100 කි.

# II කොටස

## 2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1. I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

#### 2.1.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

★ කාලය පැය 01කි. මුළු ලකුණු 40කි.

★ මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40කින් සමන්විත ය.

★ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස් වලට අනුකූලව පිළිතුරු සැපයීම අපේක්ෂා කෙරිණි.

- ප්‍රශ්න අංක 01 - 10 තෙක් ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලිවීම.
- ප්‍රශ්න අංක 11 - 20 තෙක් ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් [√] ලකුණ ද වැරදි නම් [×] ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ ලකුණු කිරීම.
- ප්‍රශ්න අංක 21 - 30 තෙක් ප්‍රශ්නවලට අදාල පිළිතුර තිත් ඉර මත ලිවීම.
- ප්‍රශ්න අංක 31 - 40 තෙක් ප්‍රශ්න වලට දී ඇති පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලකුණු කිරීම.

## 2.1.2. I ප්‍රශ්න පත්‍රය

- අංක 1 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන තුළින් තෝරා **තිත් ඉර මත** ලියන්න.

1. ශ්‍රී ලංකාව ............................................... රාජ්‍යයකි.
(සන්ධීය / වැඩවසම් / ඒකීය)

2. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව විධායක බලය ඇත්තේ ............................................... ය.
(පාර්ලිමේන්තුවට / ජනාධිපතිවරයාට / අධිකරණයට)

3. මිනිස් වුවමනා හා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා යම්කිසි මිලක් ගෙවා ලබා ගන්නා භාණ්ඩ ......................
...................... ලෙස හැඳින්වේ.
(ප්‍රාග්ධන භාණ්ඩ / ආර්ථික භාණ්ඩ / නිෂ්පාදන භාණ්ඩ)

4. දේපළ පාලනය පුරුෂයා සතු වන අතර ස්වාමිපුරුෂයාගේ අවසරය නොමැතිව දේපළ තෑගි දීමට භාර්යාවට නොහැකි බව ............................................ නීතියෙහි දැක්වේ.
(උඩරට / මුස්ලිම් / තේසවලාමෙයි)

5. සමාජයේ සෙසු ජීවීන්ට හානියක් නොවන පරිදි තම සිතැඟි ඉටු කර ගැනීම සඳහා බාහිර පරිසරයෙන් ලැබෙන අනුග්‍රහය හඳුන්වන්නේ ............................................ යනුවෙනි.
(නිදහස / වගකීම / යුතුකම)

6. මධ්‍යම ආණ්ඩුව සතු ව්‍යවස්ථානුකූල බලතලවලින් කොටසක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ම ප්‍රාදේශීය මට්ටමින් පවරා දීම ............................................ ලෙස හඳුන්වනු ලැබේ.
(බලය බෙදා හැරීම / බලය විමධ්‍යගත කිරීම / බලය ඒකරාශි කිරීම)

7. ශ්‍රී ලංකාවේ අභියාචනා කිරීමේ අවසරය ඇති අවසාන අධිකරණ බලය හිමි ආයතනය වන්නේ ...................
......................... යි.
(අභියාචනාධිකරණය / මහාධිකරණය / ශ්‍රේෂ්ඨාධිකරණය)

8. සාමකාමීව එක්රැස්වීමේ හා සංගම් පැවැත්වීමේ අයිතිය මානව අයිතිවාසිකම් යටතේ ................................
.................. හිමිකමක් ලෙස සැළකේ.
(දේශපාලන / ආර්ථික / සංස්කෘතික)

9. රටක දිළිඳුකමේ ව්‍යාප්තිය හා ප්‍රමාණය මැනීමට භාවිත කරනුයේ ............................................ දර්ශකයයි.
(මානව පීඩක / මානව දරිද්‍රතා / මානව සංවර්ධන)

10. තුන්වැනි ලෝක යුද්ධයක් ඇතිවීම වළක්වා ගැනීමේ අරමුණින් පිහිටුවා ගත් ජාත්‍යන්තර සංවිධානය ...........
.................................යි.
(නොබැඳි ජාතීන්ගේ සංවිධානය / එක්සත් ජාතීන්ගේ සංවිධානය / සාර්ක් සංවිධානය)

- අංක 11 සිට 20 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් හරි (✓) ලකුණ ද වැරදි නම් වැරදි (×) ලකුණ ද ඉදිරියේ ඇති **වරහන තුළ** ලකුණු කරන්න.

11. එක් මධ්‍යම බල අධිකාරියක් විසින් සියලු පාලන කටයුතු සිදු කරනු ලබන ආණ්ඩුක්‍රමයක් ඇති රටක් ඒකීය රාජ්‍යයක් වේ. (........)

12. කිසියම් නිෂ්පාදන හෝ පාරිභෝජන කටයුත්තක් එම ක්‍රියාවට සම්බන්ධ නැති වෙනත් පාර්ශවයක් මත ඇති කරන බලපෑම සෘණ බාහිරතා ලෙස හැඳින්වේ. (........)

13. එකම කරුණක් හෝ සිද්ධියක් පිළිබඳ ව විවිධ අදහස් දැරීමේ පුද්ගල ස්වභාවය පිළිගැනීම පුද්ගලයින් අතර ගැටුම් ඇතිවීමට හේතු වේ. (........)

14. රටක් තුළ විවිධ ජාතීන් වුව ද, ඔවුන් එක් ජාතියක් ලෙස සැලකිය යුතුය යන්න ජාතික රාජ්‍ය සංකල්පයේ අරමුණයි. (........)

15. කාලීන සමාජ අවශ්‍යතා මත ඇති වන ගැටලු නිරාකරණය කිරීම ලිබරල්වාදී රාජ්‍යයක වගකීම වේ. (........)

16. නිෂ්පාදන කාර්යයේදී ප්‍රාග්ධන භාණ්ඩ එක් වරක් පමණක් භාවිත කළ හැකි වීම විශේෂ ලක්ෂණයකි. (........)

17. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ නීති පැනවීමේ බලය ඇත්තේ පාර්ලිමේන්තුවට ය. (........)

18. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරෙන පනත්වලට අවශ්‍ය නීතිමය උපදෙස් ලබාදීම නීතිපතිතුමාගේ කාර්යයකි. (........)

19. පළාත් සභාවක පරිපාලන බලතල පිළිබඳ අවසාන අධිකාරී බලය හිමි වන්නේ ආණ්ඩුකාරවරයාටය. (........)

20. දකුණු ආසියානු කලාපීය වරණාත්මක වෙළෙඳ ගිවිසුම සංග්‍රහ (SAFTA) නමින් හැඳින්වේ. (........)

- අංක 21 සිට 30 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට අදළ පිළිතුර **තිත් ඉර මත** ලියන්න.

21. එක්සත් ජාතීන්ගේ සංවිධානයෙහි ප්‍රධාන ආයතන අතුරෙන් ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීමේ මූලික වගකීම පැවරී ඇති ආයතනය කුමක් ද? ..............................................................................

22. මධ්‍යගත සැලසුම් මණ්ඩලයක් මගින් ආර්ථික කටයුතු සැලසුම් කර ක්‍රියාත්මක කෙරෙන අර්ථ ක්‍රමය හැඳින්වෙන්නේ කවර නමකින් ද? ..............................................................................

23. නූතන ප්‍රජාතන්ත්‍රවාදයේ නිජබිම ලෙස පිළිගනු ලබන රාජ්‍යය කුමක් ද? ..............................................

24. පළාත් සභා ක්‍රමය යටතේ මධ්‍යගත ආණ්ඩුව සතු බලතල දැක්වෙන ලැයිස්තුව හඳුන්වන්නේ කවර නමකින් ද? ..............................................................

25. සෘජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රමයක් ලෙස පුනරාවර්තනය භාවිත කෙරෙන රට කුමක් ද? ..................................

26. මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු වන ආකාරයට ස්වභාව ධර්මයේ සම්පත් යොදාගෙන එහි ස්වභාවය වෙනස් කිරීම හෝ අමුතුවෙන් සකස් කර ගැනීම හඳුන්වනු ලබන්නේ කවර නමකින් ද? ......................................

27. පළාත් සභාවක ප්‍රඥප්ති හෝ වෙනත් නීතියක් යටතේ බලතල ක්‍රියාත්මක කරන තැනැත්තන්ට විරුද්ධව 'රිට්' ආඥා ලබාදීමේ බලය ඇති අධිකරණ ආයතනය කුමක් ද? ......................................................................

28. එකම සමාජයක් තුළ විවිධ සංස්කෘතීන්ට අයත් පුද්ගලයන් ජීවත් වන්නේ නම් එවැනි සමාජයක් හැඳින්වෙන්නේ කවර නමකින් ද? ..............................................................................

29. දෙපාර්ශවයක් අතර ගැටුමක් ඇති වූ විට එය විසඳීමට කටයුතු කරන පුද්ගලයා හඳුන්වන නම කුමක් ද? ..............................................................................

30. ශ්‍රී ලංකාවේ සන්නද්ධ සේවාවන්ගේ සේනාධිනායකයා ලෙස කටයුතු කරන තැනැත්තා කවරෙක් ද? ..............................................................................

- අංක 31 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියේ ඇති **වරහන** තුළ ලියන්න.

31. ගැටුම් නිරාකරණයේදී අනුගමනය කළ යුතු වැදගත් ම ක්‍රියාමාර්ගය වන්නේ
 (1) ගැටුමට මුල් වූ සාධක මුලිනුපුටා දැමීමට ක්‍රියා කිරීමයි.
 (2) ගැටුම්වලින් මගහැර යාමට ක්‍රියා කිරීමයි.
 (3) ආරක්ෂක කටයුතු තරකොට ගැටුම් ඇති වීම වැළැක්වීමයි.
 (4) සාකච්ඡා සඳහා තුන්වන පාර්ශවයක් සහභාගි කරවා ගැනීමයි. (........)

32. රජයේ පරිපාලන ක්‍රියාවකින් පුරවැසියකුගේ මූලික අයිතිවාසිකම් කඩවීමක් සම්බන්ධයෙන් පැමිණිලි කළ හැකි ආයතනය වන්නේ පහත සඳහන් කවරක් ද?
 (1) මානව හිමිකම් කොමිසම
 (2) ශ්‍රේෂ්ඨාධිකරණය
 (3) අභියාචනාධිකරණය
 (4) ඔම්බුඩ්ස්මන් (........)

33. බහු සංස්කෘතික සමාජයක පුරවැසියකුගේ වගකීම වන්නේ
 (1) තමන්ගේ සංස්කෘතිය ඉස්මතු වන සේ කටයුතු කිරීම ය.
 (2) සියලු ම සංස්කෘතීන්ට ගරු කරමින් සමානව සැලකීම ය.
 (3) වැඩි පිරිසක් අයත් වන සංස්කෘතියට අනුගතව කටයුතු කිරීම ය.
 (4) විවිධ සංස්කෘතීන් මිශ්‍ර වීම වැළැක්වීමට කටයුතු කිරීම ය. (........)

34. පරිසරය සම්බන්ධයෙන් පුරවැසියකු සතු යුතුකමක් වන්නේ

(1) සිය පාරිභෝජන අවශ්‍යතා සඳහා බාධාවකින් තොරව සම්පත් භාවිත කිරීම ය.
(2) තම අභිමතය පරිදි සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීම ය.
(3) තම බුද්ධිය මෙහෙයවා නව සම්පත් පිළිබඳ ගවේෂණය කිරීම ය.
(4) පරිසරයේ සම්පත් අරපිරිමැස්මෙන් භාවිත කිරීම ය. (........)

35. තිරසාර සංවර්ධනය ළඟා කර ගැනීම සඳහා සම්පූර්ණ කර ගත යුතු අවශ්‍යතා වන්නේ

(1) පාරිසරික අවශ්‍යතා, සමාජයීය අවශ්‍යතා සහ ආර්ථික අවශ්‍යතා
(2) මූල්‍යමය අවශ්‍යතා, සමාජයීය අවශ්‍යතා සහ ආර්ථික අවශ්‍යතා
(3) පාරිසරික අවශ්‍යතා, මූල්‍යමය අවශ්‍යතා සහ ආර්ථික අවශ්‍යතා
(4) ආර්ථික අවශ්‍යතා, සංස්කෘතික අවශ්‍යතා සහ පාරිසරික අවශ්‍යතා (........)

36. 2013 වසරේදී ප්‍රථම වරට මැතිවරණයක් පවත්වන ලද නවතම පළාත් සභාව වන්නේ

(1) උතුරු පළාත් සභාවයි.
(2) නැගෙනහිර පළාත් සභාවයි.
(3) වයඹ පළාත් සභාවයි.
(4) මධ්‍යම පළාත් සභාවයි. (........)

37. පළාත් සභා මැතිවරණයකදී ඡන්ද කොට්ඨාසයක් ලෙස සලකනු ලබන්නේ කවර පරිපාලන ඒකකයක් ද?

(1) පළාත (2) දිස්ත්‍රික්කය
(3) ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය (4) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය (........)

38. 1972 පළමුවැනි ජනරජ ව්‍යවස්ථාව තුළින් ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් අංගයක් වන්නේ

(1) විධායක ජනාධිපති තනතුරයි.
(2) සමානුපාතික නියෝජන ක්‍රමයයි.
(3) නාම මාත්‍ර විධායක ජනාධිපති තනතුරයි.
(4) ජනමත විචාරණ ක්‍රමයයි. (........)

39. ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වා ගැනීමේ ක්‍රමවේද අතුරෙන් රාජ්‍ය උපාය සම්බන්ධතා ක්‍රමවේදයක් ලෙස සැලකිය හැක්කේ

(1) යුදමය වශයෙන් අවශ්‍ය විශේෂඥ පුහුණුව රටවල්වලට ලබා දීමයි.
(2) තානාපතිවරුන්, මහ කොමසාරිස්වරුන්, වැනි රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන් මගින් රටවල් සමඟ සම්බන්ධතා ඇති කර ගැනීමයි.
(3) තම නිෂ්පාදන වෙනත් රටවල් සමඟ හුවමාරු කර ගැනීමයි.
(4) කලාපීය වශයෙන් රටවල් ඒකරාශි කර විවිධ සංවිධාන පිහිටුවා ගැනීමයි. (........)

40. තානාපතිවරයකු හෝ රාජ්‍ය දූතයකු තුළ තිබිය යුතු ගුණාංගයක් වන්නේ මින් කවරක් ද?

(1) රාජ්‍යයන් දෙක අතර මිත්‍රත්වය තහවුරු කිරීම.
(2) තම රටේ ප්‍රතිපත්ති ක්‍රියාවේ යෙදවීම.
(3) තම රට පිළිබඳව හා තමා සේවය කරන රට පිළිබඳවත් මනා අවබෝධයක් තිබීම.
(4) තම රට පිළිබඳ යහපත් ප්‍රතිරූපයක් ඇති කිරීම. (........)


2.1.3. **I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | ඒකීය | 21. | ආරක්ෂක මණ්ඩලය |
| 02. | ජනාධිපතිවරයාට | 22. | සමාජවාදී |
| 03. | ආර්ථික භාණ්ඩ | 23. | ග්‍රීසිය |
| 04. | තේසවලමෙයි | 24. | සංවෘත |
| 05. | නිදහස | 25. | ස්විස්ටර්ලන්තය |
| 06. | බලය බෙදා හැරීම | 26. | නිෂ්පාදනය /නිමැවුම |
| 07. | ශ්‍රේෂ්ඨාධිකරණය | 27. | පළාත්බද මහාධිකරණය |
| 08. | දේශපාලන | 28. | බහු සංස්කෘතික |
| 09. | මානව දරිද්‍රතා | 29. | සමථකරු/මැදිහත්කරු |
| 10. | එක්සත් ජාතීන්ගේ සංවිධානය | 30. | විධායක ජනාධිපති/ජනාධිපති |
| 11. | √ | 31. | 1 |
| 12. | √ | 32. | 2 / 4 |
| 13. | × | 33. | 2 |
| 14. | √ | 34. | 4 |
| 15. | √ | 35. | 1 |
| 16. | × | 36. | 1 |
| 17. | √ | 37. | 2 |
| 18. | √ | 38. | 3 |
| 19. | √ | 39. | 2 |
| 20. | × | 40. | 3 |

**නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 40කි.**

### 2.1.4. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන

★ I පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාරය 1 (පිටුව 8) ඇසුරෙන් සකස් කර ඇත.




**I කොටස (ප්‍රශ්න අංක 01 - 10 දක්වා)**

**මෙම කොටසට පිළිතුරු සැපයීමේදී වරණ තුනක් අතුරින් නිවැරදි පිළිතුර තේරීම අපේක්ෂා කෙරේ.**

ප්‍රශ්න අංක 1 සිට 10 දක්වා සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේදී අයදුම්කරුවන් 40%ට වඩා පහසුතාවක් දක්වා ඇත. අයදුම්කරුවන් වැඩිම පහසුතාවක් පෙන්වා ඇත්තේ 5වන ප්‍රශ්නය සඳහා වන අතර එහි පහසුතාව 84%කි. මෙයට හේතු වී ඇත්තේ ප්‍රජාතාන්ත්‍රික සමාජයක පදනම වන නිදහස යන සංකල්පය පිළිබඳ අපේක්ෂකයා තුළ පැවති පැහැදිලි අවබෝධයයි.

අයදුම්කරුවන් අඩුම පහසුතාවක් පෙන්වා ඇත්තේ ප්‍රශ්න අංක 3 සඳහා වන අතර එහි පහසුතාව 41%කි. මිනිස් අවශ්‍යතා සපුරා ගැනිම සඳහා යම්කිසි මිලක් ගෙවා ලබා ගන්නා භාණ්ඩ හඳුන්වන නාමය පිළිබඳව ප්‍රශ්නයෙන් විමසා ඇත. අපේක්ෂකයන් තුළ 'ආර්ථික' යන සංකල්පය පිළිබඳ නිරවුල් වැටහීමක් නොමැති වීම මෙයට හේතු වී ඇති බව පෙනේ. සංකල්පය පිළිබඳ දැනුම සිසුන් තුළ ගොඩනැගීම සඳහා සුදුසු අභ්‍යාස හා ක්‍රියාකාරකම් ලබා දීම කෙරෙහි අවධානය යොමු විය යුතුය.

ප්‍රශ්න අංක 1, 2, 5, 6, 8, 9, 10 සඳහා පිළිතුරු සැපයීමේ සතුටුදායක සිසු සාධන මට්ටමක් පෙන්නුම් කර ඇත. නිරන්තරව අධ්‍යයනයට යොමු කරන විෂය කොටස් ඇසුරින් මෙම ප්‍රශ්න සකසා තිබීම මීට හේතු විය හැකිය. ප්‍රශ්න අංක 3 සහ 7 සඳහා අඩු සාධන මට්ටමක් පෙන්නුම් කර ඇත. මෙයට හේතු වී ඇත්තේ න්‍යායාත්මක දැනුම ප්‍රායෝගිකව ගැළපීමේදී අයදුම්කරුවන් තුළ පැහැදිලි අවබෝධයක් නොතිබීමයි. ඒ පිළිබඳව සිසුන්ගේ වැඩි අවධානයක් යොමු විය යුතු බව නිරීක්ෂණ තුළින් ගම්‍ය වේ.

## II කොටස (ප්‍රශ්න අංක 11 - 20 දක්වා)

**මෙම කොටසට පිළිතුරු සැපයීමේදී දී ඇති ප්‍රකාශන සඳහා වැරදි/ නිවැරදි සළකුණු කිරීම අපේක්ෂිත විය.**

අයදුම්කරුවන් වැඩිම පහසුතාවක් පෙන්වා ඇත්තේ 11වන ප්‍රශ්නය සඳහා වන අතර එහි පහසුතාව 90%කි. මේ සඳහා හේතු වී ඇත්තේ ඒකීය රාජ්‍යයක ලක්ෂණ පිළිබඳව නිතර සාකච්ඡා වූ හෙයින් ඒවා අයදුම්කරුවන් හොඳින් හඳුනාගෙන තිබීමය.

අයදුම්කරුවන් අඩුම පහසුතාවක් පෙන්වා ඇත්තේ 20 වන ප්‍රශ්නය සඳහා වන අතර එහි පහසුතාව 26%කි. ජාත්‍යන්තර වෙළඳාමේ ගිවිසුම් පිළිබඳ නිරවුල් අවබෝධයක් අපේක්ෂකයන් තුළ නොමැති වීම මේ සඳහා බලපා ඇති බව පෙනේ. මෙහි සාධන මට්ටම දියුණු කිරීම සඳහා ජාත්‍යන්තර වෙළඳාමේ වෙළඳ ගිවිසුම් පිළිබඳව සිසුන් තුළ ඇති දැනුම වැඩි දියුණු කිරීමට සුදුසු ක්‍රමවේදයක් සැකසිය යුතු වේ.

ප්‍රශ්න අංක 11 - 20 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු ලිවීමේ සමස්තය ගත් විට ප්‍රශ්න අංක 11 සහ 18 සඳහා ඉහළ සාධන මට්ටමක් පෙන්නුම් කර ඇති අතර ප්‍රශ්න අංක 14, 17 සහ 16 සඳහා සතුටුදායක සාධන මට්ටමක් පෙන්නුම් කර ඇත. 13, 15 සහ 20 ප්‍රශ්න සඳහා 50%ට වඩා අඩු පහසුතාවක් දක්වා ඇත. විෂය ඒකක පිළිබඳ නිශ්චිත දැනුම වර්ධනය වන ආකාරයේ අභ්‍යාස කරවීම තුළින් මෙම සාධන මට්ටම වඩාත් ඉහළ නංවා ගත හැකිය.

## III කොටස (ප්‍රශ්න අංක 21 - 30 දක්වා)

**මෙම කොටසට පිළිතුරු සැපයීමේදී එක් එක් ප්‍රශ්නයට අදාළ පිළිතුර තිත් ඉර මත ලිවීම අපේක්ෂා කෙරේ.**

මෙයින් වැඩිම පහසුතාවක් පෙන්වා ඇත්තේ ප්‍රශ්න අංක 28 සඳහා වන අතර එහි පහසුතාව 79%කි. මෙහි සාධන මට්ටම ඉහළ යාමට බලපා ඇත්තේ අනෙක් ඒකක වලට සාපේක්ෂව බහු සංස්කෘතික සමාජය පිළිබඳව අයදුම්කරුවන් තුළ පුළුල් අවබෝධයක් පැවතීම බව කිව හැකිය.

අයදුම්කරුවන් අඩු පහසුතාවක් පෙන්වා ඇත්තේ 27 වන ප්‍රශ්නයටයි. එහි පහසුතාවය 14%කි. අධිකරණ ආයතන පිළිබඳව අසා ඇති මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු ලබා දීමේදී කාලීන තොරතුරු පිළිබඳ අයදුම්කරුවන් තුළ නිශ්චිත අවබෝධයක් නොමැති වීමයි. මේ සඳහා නිරතුරුවම ගුරුභවතුන් දැනුම යාවත්කාලීන කර ගනිමින් සිසුන් ඒ සඳහා යොමු කරලීම පිළිබඳව වැඩි අවධානයක් යොමු කළ යුතුව ඇත.

සමස්තයක් ලෙස ගත් විට මෙම තුන්වන කොටසෙහි පිළිතුරු සැපයීමේදී ප්‍රශ්න 28 හා 30 සඳහා සතුටුදායක තත්ත්වයක් පෙන්නුම් කරයි. පිළිවෙලින් 79% හා 66% ලෙස පහසුතාව දක්වා ඇත. විවිධ සංස්කෘතීන් හා විධායක ජනාධිපති ධූරය කාලීන මාතෘකා බවට පත්ව තිබීම මෙයට හේතු වූ බව කිව හැකිය. ඉතිරි ප්‍රශ්න 8 හි සාධනය 44% - 14%ක් අතර මට්ටමක පවතී. මෙකී කොටසේ සාධන මට්ටම දියුණු කිරීම සඳහා පෙළපොත වැඩි වශයෙන් පරිශීලනය කිරීමත්, කාලින දැනුම වර්ධනය කර ගැනීමත් අවශ්‍ය වන අතර ඒ සඳහා අවැසි ක්‍රමවේදයන් කෙරෙහි ගුරු භවතුන්ගේ වැඩි අවධානය යොමු විය යුතු වේ.

## IV කොටස (ප්‍රශ්න අංක 31 - 40 දක්වා)

**මෙම කොටසට පිළිතුරු සැපයීමේදී වරණ හතරක් තුළින් නිවැරදි වරණය තෝරා දැක්වීම අපේක්ෂා කෙරේ.**

මේ අතුරින් වැඩිම පහසුතාවක් පෙන්නුම් කර ඇත්තේ 33 වන ප්‍රශ්නයයි. එහි පහසුතාව 90%කි. මෙයට හේතු වී ඇත්තේ බහු සංස්කෘතික සමාජයක පුරවැසියන්ගේ වගකීම් පිළිබඳ නිවැරදි අවබෝධයක් අපේක්ෂකයන් තුළ තිබීමයි. මෙම කොටසේ අඩු සාධන මට්ටමක් පෙන්වා ඇත්තේ 37 වන ප්‍රශ්නයටය. එහි පහසුතාව 35%කි. මේ සඳහා බලපා ඇත්තේ පළාත් සභාවක ව්‍යුහය හා සංයුතිය පිළිබඳ නිරවුල් අවබෝධයක් අපේක්ෂකයන් තුළ නොතිබීමයි. පළාත් සභා මැතිවරණයක් පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකමක් තුළින් සිසුන්ගේ ඒ පිළිබඳ කුසලතාව වර්ධනය කළ හැකිය.

හතරවන කොටසෙහි සමස්තය දෙස බලන විට පහසුතාව 50%ට වැඩි වී ඇත්තේ ප්‍රශ්න අංක 33, 34 සහ 36 සඳහා පමණි. ඉතිරි ප්‍රශ්න වූ 31, 32, 35, 37, 38, 39 සහ 40 සඳහා පැවති සාධන මට්ටම් සතුටුදායක තත්ත්වයක නොමැත. මේ සඳහා හේතු වී ඇත්තේ වරණ හතරක් තුළින් නිවැරදි වරණය තේරීම පිළිබඳව අයදුම්කරුවන් දැක් වූ අඩු කුසලතාවයි. මෙකී කුසලතාවය වර්ධනය කිරීම සඳහා සිසුන් නිරන්තරයෙන් අභ්‍යාසකරණයට යොමු කළ යුතුය.

I ප්‍රශ්න පත්‍රයේ අංක 11 හා 33 ප්‍රශ්නයන්හි පහසුතාව 90%ක් ද, ප්‍රශ්න අංක 5, 9, 10, 14, 17, 18, 28 සහ 34 යන ප්‍රශ්න වල පහසුතාව 70%ට වඩා වැඩි වී ඇත.

සමස්තයක් ලෙස I පත්‍රයේ සාධන මට්ටම් පිළිබඳ නිරීක්ෂණය කිරීමේදී ප්‍රශ්න අංක 1, 2, 4, 6, 8, 12, 16, 19, 23, 30 සහ 36 ප්‍රශ්න වල පහසුතාව 50%ට වඩා වැඩි වී ඇත. ඉතිරි ප්‍රශ්න සියල්ලෙහි පහසුතාව 50%ට වඩා අඩු වී ඇත.

පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය විෂයෙහි I පත්‍රයේ සමස්ත පහසුතාව 53%කි. මෙය තවත් වර්ධනය කර ගත යුතුය. මේ සඳහා එදිනෙදා ජීවිතයට වඩාත් ප්‍රායෝගිකව සම්බන්ධ වන මෙම විෂයෙහි දැනුම, ආකල්ප, කුසලතා වඩාත් වර්ධනය කිරීම සඳහා කාලීන සමාජ, දේශපාලන, ආර්ථික, පාරිසරික තත්ත්වයන් පිළිබඳ සමීප තොරතුරු ලබා ගත හැකි මාධ්‍යයන් වැඩි වශයෙන් ගවේෂණයට හා පරිශීලනයට සිසුන් යොමු කළ යුතුය. එමෙන්ම පෙළපොත හා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පරිශීලනය කරමින්, සිසුන්ට වඩාත් සමීප අත්දැකීම් ලබා දීමට ගුරුවරුන් ක්‍රියා කළ යුතුය. ශිෂ්‍යයන්ටද පෙළපොත අධ්‍යයනය කිරීමට යොමු කිරීම මෙන්ම වර්තමාන සමාජය පිළිබඳ අවබෝධයකින් යුතුව සිටීමට යොමු කිරීම වැදගත් වේ.

### 2.1.5. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

1 ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ ප්‍රතිශත සළකා බැලීමේදී ප්‍රශ්න අංක 1 සිට 10 දක්වා ප්‍රශ්න වරණ තුනක් තුළින් නිවැරදි පිළිතුර තෝරා ලිවිය යුතු විය. මේ අතුරින් ප්‍රශ්න අංක 05 සඳහා පහසුතාව 84%ක් විය. ප්‍රශ්න අංක 9, 10 ප්‍රශ්න වඩාත් සරල වූ හෙයින් එහි පහසුතාව පිළිවෙලින් 70%, 73% විය. ප්‍රශ්න අංක 1, 2, 4, 6, 8 ප්‍රශ්න සඳහා 50%කට වඩා පහසුතාවක් පෙන්නුම් කර ඇත. ප්‍රශ්න අංක 3 සහ 7 සඳහා පහසුතාව 48%කි. මෙයට හේතුව ලෙස න්‍යායාත්මක දැනුම ප්‍රායෝගිකව ගැලපීමේදී සිසුන් තුළ පැහැදිලි අවබෝධයක් නොවූ බව පෙනී යයි. ඒ පිළිබඳව සිසුන්ගේ වැඩි අවධානයක් යොමු විය යුතු බව නිරීක්ෂණ තුළින් ගම්‍ය වේ.

ප්‍රශ්න අංක 11 සිට 20 දක්වා දි ඇති ප්‍රකාශන සඳහා හරි /වැරදි සලකුණු කිරීම අපේක්ෂිත විය. 11 වන ප්‍රශ්නය සඳහා 90%ක පහසුතාවක් පෙන්නුම් කර ඇත. ප්‍රශ්න අංක 18, 14, 17 සහ 16 පහසුම ප්‍රශ්න වූ අතර ඒවායේ පහසුතාව පිළිවෙලින් 85%, 78%, 70%, 66% කි. ප්‍රශ්න අංක 12, 19 සඳහා 50%කට වඩා වැඩි පහසුතාවක්ද, ප්‍රශ්න අංක 13, 15, 20 සඳහා 50%කට වඩා අඩු පහසුතාවක් පෙන්නුම් කර ඇත. කාලීන ගැටලු හා අවස්ථා පිළිබඳ ශිෂ්‍ය අවබෝධය අඩු මට්ටමක පැවතීම හේතුව විය හැකිය.

ප්‍රශ්න අංක 21 - 30 අතර ප්‍රශ්න සඳහා අදාළ පිළිතුරු තිත් ඉර මත ලිවීම අපේක්ෂා කර ඇත. එම ප්‍රශ්න අතුරින් ප්‍රශ්න අංක 23, 28, 30 යන ප්‍රශ්න වල පහසුතාව 50%කට වඩා වැඩි වී ඇති අතර ප්‍රශ්න අංක 28 සඳහා පහසුතාව 79%කි. ප්‍රශ්න අංක 21, 22, 24, 25, 26, 27 සහ 29 යන ප්‍රශ්න වල පහසුතාව 50%කට වඩා අඩු වී ඇත. මේ අතුරින් 27 වෙනි ප්‍රශ්නයේ පහසුතාව 14%කි. මෙයට හේතුව ලෙස නිගමනය කළ හැක්කේ කාලීන තොරතුරු පිළිබඳ ගුරුභවතුන් හා සිසුන්ගේ අවධානය අඩු වීමයි. නිරතුරුවම ගුරුභවතුන් දැනුම අලුත් කර ගනිමින් සිසුන්ද ඒ සඳහා යොමු කරලීම පිළිබඳව අවධානය යොමු විය යුතුව ඇත.

ප්‍රශ්න අංක 31 - 40 දක්වා ප්‍රශ්න සඳහා වරණ 4කින් නිවැරදි වරණය තෝරා දැක්විය යුතු ය. මෙම ප්‍රශ්න අතුරින් ප්‍රශ්න අංක 33 සඳහා පහසුතාව 90%කි. ප්‍රශ්න අංක 34 හි පහසුතාව 78%කි. ප්‍රශ්න අංක 36 සඳහා 59%ක පහසුතාවක් ද, ප්‍රශ්න අංක 31, 32, 35, 37, 38, 39 සහ 40 යන ප්‍රශ්න සියල්ලෙහි පහසුතාව 50%කි.

සමස්තයක් ලෙස මෙම ප්‍රශ්න පත්‍රයේ අංක 11,33 ප්‍රශ්නයන්හි පහසුතාව 90%ක් ද, ප්‍රශ්න අංක 5,9, 10, 14, 17, 18, 28 සහ 34 යන ප්‍රශ්න වල පහසුතාව 70%ට වඩා වැඩි වී ඇත.

සමස්තයක් ලෙස 1 වන පත්‍රයේ පිළිතුරු ලිවීම පිළිබඳ නිරීක්ෂණය කිරීමේදී ප්‍රශ්න අංක 1, 2, 4, 6, 8, 12, 16, 19, 23, 30 සහ 36 යන ප්‍රශ්න වල පහසුතාව 50%ට වඩා වැඩි වී ඇත. ඉතිරි ප්‍රශ්න සියල්ලෙහි පහසුතාව 50%ට වඩා අඩු වී ඇත.

පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය විෂයෙහි I පත්‍රයේ පහසුතාව 53%ක් වීම සතුටුදායක තත්ත්වයකි. එදිනෙදා ජීවිතයට වඩාත් ප්‍රායෝගිකව සම්බන්ධ වන විෂයක් වූ හෙයින් සිසුන්ගේ දැනුම, අවබෝධය හා භාවිත හැකියාව වර්ධනය වීම මෙයට පාදක වී ඇති බව කිව හැකිය.

තවද මෙම ප්‍රශ්න පත්‍රයේ පහසුතාව අඩු වී ඇත්තේ අංක 21 - 30 දක්වා, නිශ්චිත පිළිතුරු සැපයිමේදී සිසුන් තුළ පවතින දුර්වලතාවයත් අංක 31 - 40 දක්වා, ප්‍රශ්න අවබෝධ කර ගැනිමේ දුර්වලතාවයත් බව පැහැදිලි වේ. මේ තත්ත්වය මඟ හරවා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග ලෙස කාලීන සමාජ, දේශපාලන, ආර්ථික, පාරිසරික තත්ත්වයන්ගේ තොරතුරු පිළිබඳව නිරන්තරව විමර්ශනය කිරීමට සිසුන් යොමු කරවිය යුතුය. එසේම තෝරා ගත් විෂයය කොටස් ඉගැන්වීමට වඩා සමස්ත විෂය නිර්දේශය පිළිබඳවම ශිෂ්‍යයාට අත්දැකීම් ලබා දීම අවශ්‍යය.

## 2.2. II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.2.1. II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

**කාලය පැය 02කි. මුළු ලකුණු 60කි.**

පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වන අතර, කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 10කින් සමන්විත වේ. එක් ප්‍රශ්නයකට ලකුණු 02ක් බැගින් මුළු ලකුණු 20කි.

සෙසු ව්‍යුහගත ප්‍රශ්න 6න් 4කට පිළිතුරු සැපයීම අපේක්ෂා කෙරේ. එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් මුළු ලකුණු 40කි.

### 2.2.2. II ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න තෝරා ගැනීම හා ලකුණු ලබා ගත් ආකාරය

දෙවන පත්‍රයෙහි පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ. (9 පිටුවේ සඳහන් 1.3.2. හි ප්‍රස්තාරය 2 සහ ප්‍රස්තාරය 3 අධ්‍යයනය කරන්න) එහෙත් පිළිතුරු සපයා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 99%කි. 1%ක් ප්‍රශ්නය තෝරා නොගැනීමට හේතුව වූයේ අපේක්ෂකයින්ගේ මූලික සාක්ෂරතාව නොමැතිවීම හෝ ප්‍රශ්න පත්‍රයේ මූලික උපදෙස් ග්‍රහණය කර නොගැනීම විය හැකිය. පිළිතුරු සැපයූ අයදුම්කරුවන්ගෙන් 16%ක් 0 - 25 ලකුණු ප්‍රාන්තරයේද, 49%ක් ලකුණු 26 - 50 ප්‍රාන්තරයේද විය. ලකුණු 51 - 75 ප්‍රාන්තරයේ 26%ක් වූ අතර ලකුණු 76 - 100 දක්වා අපේක්ෂක ප්‍රතිශතය 9%කි.

මෙම ප්‍රශ්න පත්‍රයේ තෝරා ගත යුතු වූ ප්‍රශ්න අතරින් අපේක්ෂකයින් වැඩි පිරිසකගේ අවධානයට ලක් වූයේ 7 ප්‍රශ්නයයි. එහි ප්‍රතිශතය 80%කි. තෝරා ගත් අයදුම්කරුවන්ගෙන් ලකුණු 76 - 100 ප්‍රාන්තරයේ 46%ක්ද, ලකුණු 51 - 75 ප්‍රාන්තරයේ 24%ක්ද විය. ඒ අනුව ලකුණු 50 -100 ප්‍රාන්තරයේ අපේක්ෂක ප්‍රතිශතය 70%කි. ප්‍රශ්නය තෝරා ගත් අපේක්ෂකයින්ගෙන් 30%ක් ලබා ඇත්තේ ලකුණු 50ට අඩුවෙන් වීමද සැළකිය යුතු කරුණකි.

තෝරා ගත යුතු වූ ප්‍රශ්න අතරින් දෙවන ස්ථානය හිමි වී ඇත්තේ තුන්වන ප්‍රශ්නයටයි. එහි අපේක්ෂක ප්‍රතිශතය 77%කි. එයින් ලකුණු 50 -100 ප්‍රාන්තරයේ අපේක්ෂක ප්‍රතිශතය වූයේ 45%කි. එලෙස ඉහළ ලකුණු පරාසයක රැඳී සිටි අපේක්ෂක ප්‍රතිශතය අඩු වූයේ ප්‍රශ්නයේ I, II කොටස් වලට අදාල විෂය කරුණු සාධනය ප්‍රමාණවත් නොවූ නිසාය.

ප්‍රශ්න පත්‍රයේ තෝරා ගැනීමේ තෙවන ස්ථානය හිමි වී ඇත්තේ දෙවන ප්‍රශ්නයටයි. එම ප්‍රතිශතය 68%කි. ඉන් 49%ක් ලකුණු 50 -100 අතර ලකුණු ප්‍රාන්තරයේ විය. එහිදීද I, II කොටස් වල අනු කොටස්හි සංකල්ප සාධනයේ දුර්වලත්වය ඊට බලපා තිබූ බව පෙනී යයි.

ප්‍රශ්න අංක හතර තෝරා ගත් අපේක්ෂක ප්‍රතිශතය 66%ක් වෙමින් සිව්වන ස්ථනයේ පවතී. එයින් ලකුණු 50 -100 ප්‍රාන්තරයේ අපේක්ෂක ප්‍රතිශතය 31%කි. ලකුණු 50ට අඩු ප්‍රතිශතය ඉහළ යාමට හේතු වූයේ I, II කොටස් වල සංකල්ප සාධනය ප්‍රමාණවත් නොවීමයි.

ප්‍රශ්න පත්‍රයේ පස්වන ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 53%කි. ලකුණු 50 -100 අතර ලබා ගෙන ඇත්තේ එම අයදුම්කරුවන්ගෙන් 20%කි. ප්‍රශ්නයේ කැපී පෙනෙන ලක්ෂණය වන්නේ ප්‍රශ්නය තෝරා ගත් අපේක්ෂක ප්‍රතිශතයෙන් 63%ක්ම ලබා ගෙන ඇත්තේ ලකුණු 00 -25 අතර වීමයි. එලෙස තෝරා ගැනීම මෙන්ම ලකුණු ලබා ගැනීමේ පහසුතාව අඩු වූයේ ප්‍රශ්නයේ කොටස් තුනටම අදාළ විෂය කරුණු පිළිබඳව සිසු අවධානය ප්‍රමාණවත් නොවීමයි. නීතිය හා අධිකරණය පිළිබඳ සෑම පුරවැසියෙක්ම දැනුවත්ව සිටීම අත්‍යාවශ්‍ය වේ.

අඩුම තෝරා ගැනීමට ලක් වී ඇත්තේ ප්‍රශ්න පත්‍රයේ හයවන ප්‍රශ්නයයි. තෝරා ගත් අපේක්ෂක ප්‍රතිශතය 46%කි. එයින් 31%ක් ලකුණු 50 -100 අතර වූ අතර ලකුණු 00 -50 අතර 69%ක් වන ඉහළ අපේක්ෂක ප්‍රතිශතයක් විය. මෙම ප්‍රශ්නයේ දෙවන කොටස සඳහා ලකුණු ලැබීම ඉතා අඩු මට්ටමක විය.

සමස්තයක් ලෙස ගත් කළ වැඩි අපේක්ෂක පිරිසක් තෝරා ගත් ප්‍රශ්න අංකය 7 වූ අතර වැඩිම පිරිසක් ඉහළම ලකුණු පරාසයේ පිහිටි ප්‍රශ්නයද විය. එයට හේතු වූයේ පරිසරය පිළිබඳ වර්තමාන සමාජය වැඩිම අවධානයකින් යුක්ත වීමත්, පාසල් තුළ විෂය සමෝධානයෙන් අදාල දැනුම පුළුල් කර ගත හැකි වීමත් නිසාය.

එමෙන්ම අඩුම තෝරා ගැනීමක් වූ අයිතිවාසිකම් වල වැදගත්කම අවධාරණය කළ හයවන ප්‍රශ්නයේ ලකුණු ලබා ගැනීමද දුර්වල මට්ටමක පවතී. ඊට හේතු වූයේ විෂය ක්ෂේත්‍රයේ පුළුල් බවත්, අදාළ කරුණු ග්‍රහණය කර ගැනීමේ දුර්වලතාවත්ය.

II ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න තෝරා ගැනීමේදී නීතිය හා යුක්තිය, අයිතිවාසිකම් වැනි මාතෘකා වලට අඩු අවධානයක් යොමුව ඇති බව පෙනේ. එම ප්‍රශ්න වලදී නිශ්චිත විෂය කරුණු ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය වීම සාධනය අඩු වීමට හේතුව විය හැකිය. පුරවැසියන් ලෙස මෙම අංශ පිළිබඳ දැනුවත් වීම අත්‍යාවශ්‍ය බැවින් සේවාස්ථ සැසි තුළින් ගුරුවරුන්ගේ දැනුවත්භාවය ඉහළ නැංවීම අවශ්‍යය. එසේම ශිෂ්‍යයන්ටද ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීමට අවස්ථා සැලසීම පාසලේම වගකීම වේ.

2.2.3. **II** ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය සහ නිරීක්ෂණ හා නිගමන

★ **II** පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාර අංක 2, 3 සහ 4 ඇසුරින් සකස් කර ඇත.

## 01 ප්‍රශ්නය

| | |
|---|---|
| (01) අපේක්ෂණය : | බහු සංස්කෘතික සමාජය, යුක්තිය හා නීතිය, රාජ්‍යය, සංවර්ධනය, පළාත් පාලනය, පරිසරය, ජාත්‍යන්තර සම්බන්ධතා සහ යහ පාලනය යන ක්ෂේත්‍ර පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීම. |

**1.** (i) බහු සංස්කෘතික සමාජයක විසරණය සිදුවන ක්‍රම **දෙකක්** නම් කරන්න.

(ii) යුක්තිය යනු අපක්ෂපාතීව කටයුතු කිරීමයි. යුක්තිය තුළ අන්තර්ගත වන ප්‍රධාන කරුණු **දෙක** මොනවාදැයි සඳහන් කරන්න.

(iii) ඉස්ලාම් නීතියේ ප්‍රධාන මූලාශ්‍ර **දෙකක්** සඳහන් කරන්න.

(iv) වායු දූෂණය නිසා ඇති විය හැකි අහිතකර ප්‍රතිඵල **දෙකක්** සඳහන් කරන්න.

(v) සන්ධීය රාජ්‍යයන් යටතේ බලය බෙදා හැර ඇති රටවල් **දෙකක්** නම් කරන්න.

(vi) ආර්ථික සංවර්ධනය උදෙසා ශ්‍රී ලංකාවේ මෑතකදී ක්‍රියාත්මක කරන ලද මහා පරිමාණ ව්‍යාපෘති **දෙකක්** නම් කරන්න.

(vii) ශ්‍රී ලංකාවේ සෑම පළාත් පාලන ආයතනයකට ම පොදුවේ පැවරෙන බලතල හා කාර්යයන් කොටස් තුනකි. ඉන් **දෙකක්** නම් කරන්න.

(viii) ජාත්‍යන්තර වෙළෙඳාමේ ප්‍රධාන කොටස් **දෙක** නම් කරන්න.

(ix) යහපත් පුරවැසියකු ලෙස ප්‍රගුණ කළ යුතු ගුණාංග **දෙකක්** සඳහන් කරන්න.

(x) ශ්‍රී ලංකාවට විදේශාධාර ලබා දෙන අන්තර්ජාතික සංවිධාන **දෙකක්** නම් කරන්න.

(ලකුණු 02 × 10 = 20 යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(1) (i)
- සෘජු විසරණය
- අන්තර් සම්බන්ධතා නිසා ඇතිවන විසරණය
- ප්‍රබෝධාත්මක විසරණය

(මේවායින් දෙකක් නම් කිරීමට ලකුණු 02යි)

(ii)
- සත්‍යය
- සදාචාරය

(ලකුණු 1 x 2= 02යි)

(iii)
- අල් - කුර් - ආනය
- අල් - හදීස් - සුන්නාහ්
- ඉජ්මා
- කියාස්

(මේවායින් දෙකක් නම් කිරීමට ලකුණු 02යි)
(අනිවාර්ය ලකුණු 02ක් ප්‍රදානය කරන ලදි)

(iv)
- ඕසෝන් ස්ථරයට හානි සිදු වීම
- පාරජම්බුල කිරණ පෘථිවි පෘෂ්ඨයට ළඟාවීම
- වායු ගෝලය උණුසුම් වීම
- අම්ල වැසි හට ගැනීම
- ශ්වසන රෝග හට ගැනීම
- සමේ පිළිකා හට ගැනීම
- ජෛව විවිධත්වයට හානි සිදු වීම හා ජෛව නිෂ්පාදන අඩු වීම
- සමුද්‍ර ජල මට්ටම් ඉහළ යාම
- දේශගුණ විපර්යාස ඇති වීම
- සූර්යාලෝකය පෘථිවි පෘෂ්ඨයට ළඟාවීම වළක්වන වලාකුළු වර්ධනය වීම

(මේවායින් දෙකක් නම් කිරීමට ලකුණු 02යි)

*මීට අමතරව වෙනත් නිවැරදි පිළිතුරු දී ඇත්නම් ඒවාද සලකා බලන්න.

(v)
- ස්විස්ටර්ලන්තය
- ඇමරිකා එක්සත් ජනපදය/ ඇමරිකාව
- ඉන්දියාව
- කැනඩාව
- ඕස්ට්‍රේලියාව
- දකුණු අප්‍රිකාව වැනි රටවල් දෙකක් නම් කිරීමට

**(ලකුණු 1 x 2 = 02යි)**

(vi)
- දක්ෂිණ අධිවේගී මාර්ගය
- කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය } අධිවේගී මාර්ග එක කරුණක් ලෙස ගන්න.
- කොළඹ දකුණ වරාය ව්‍යාපෘතිය
- හම්බන්තොට මාගම්පුර වරාය ව්‍යාපෘතිය
- නොරච්චෝලෙයි ගල් අඟුරු බලාගාරය
- කෙරවලපිටිය ඇවිතෙල් බලාගාරය
- යාපනය - චුන්නාකම් විදුලි සම්ප්‍රේෂණ මධ්‍යස්ථානය
- ඇඳුරු ඔය ජලාශ ව්‍යාපෘතිය
- ඔලුවිල් වරාය ව්‍යාපෘතිය
- රඹකැන් ඔය ජලාශ ව්‍යාපෘතිය
- උමා ඔය - පහළ ඌව සංවර්ධන ව්‍යාපෘතිය
- මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතිය
- මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපල

**(මෙවැනි වැදගත් ව්‍යාපෘති දෙකක් නම් කිරීමට ලකුණු - 02යි)**
**මීට අමතරව වෙනත් අදාළ ව්‍යාපෘති නම් කර ඇත්නම් ඒවාද සැලකිල්ලට ගන්න.**

(vii)
- පොදු මංමාවත්
- මහජන සෞඛ්‍යය
- මහජන උපයෝගිතා සේවා

**(මේවායින් දෙකක් නම් කිරීමට ලකුණු 02යි)**

(viii)
- ද්වි පාර්ශවික
- බහු පාර්ශවික

**(ලකුණු 1 x 2 = 02යි)**


(ix)
- විනයගරුක වීම
- අන් අයගේ අයිතීන් පිළිගැනීම හා යුතුකම් ඉටු කිරීම
- සාකච්ඡා කිරීමෙන් ගැටලු විසඳා ගැනීම
- අන් අයට හා ඔවුන්ගේ මත වලට ගරු කිරීම
- නීතිගරුකව හා සාමකාමීව හැසිරීම
- පොදු දේපල ආරක්ෂා කිරීම
- ජාතික උරුම, ස්වභාවික සම්පත් රැක ගැනීම හා පෝෂණය කිරීම

**(මින් දෙකක් සඳහන් කිරීමට ලකුණු 02)**
**මීට අමතර වෙනත් අදාල පිළිතුරු ලියා ඇත්නම් ඒවාද සලකා බලන්න.**


(x)
- ලෝක බැංකුව (IBRD)
- අන්තර් ජාතික සංවර්ධන සංගමය
- ආසියානු සංවර්ධන බැංකුව
- කොළඹ ක්‍රමය
- ඔපෙක් සංවිධානය

**(මෙවැනි සංවිධාන දෙකක් නම් කිරීමට ලකුණු - 02යි)**
**(I ප්‍රශ්නය මුළු ලකුණු 20යි)**

1 වන ප්‍රශ්නය පිළිබඳ සමස්ත නිරීක්ෂණ හා නිගමන :




පළමු ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නය වේ. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 16%ක් ද,
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 50%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 26%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 8%ක් ද
ලෙස ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයට අනුකොටස් 10ක් ඇති අතර පහසුතාව 40%ට වඩා වැඩි අනු කොටස් වශයෙන් (i), (iii), (iv), (v), (vi) හා (ix) කොටස් දැක්විය හැකි අතර, පහසුතාව 40% අඩු අනුකොටස් වශයෙන් (ii), (vii), (viii) හා (x) කොටස් දැක්විය හැක.

මෙය අනිවාර්ය ප්‍රශ්නයකි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20කි. මෙම ප්‍රශ්නය විෂය නිර්දේශයේ ඒකක වැඩි ප්‍රමාණයක් ආවරණය වන පරිදි සකසා ඇත.

මෙම ප්‍රශ්නයද තෝරා ගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 99%කි. 1%ක් ප්‍රශ්නය තෝරා නොගැනීමට හේතුව වූයේ එම අපේක්ෂකයින් හට මූලික සාක්ෂරතාව නොමැති වීම හෝ ප්‍රශ්න පත්‍රයේ මූලික උපදෙස් ග්‍රහණය කර නොගැනීම විය හැකිය .

පිළිතුරු සැපයූ අයදුම්කරුවන්ගෙන් 16%ක් 00 - 25 ලකුණු ප්‍රාන්තරයේ ද, 50%ක් 26 - 50 ලකුණු ප්‍රාන්තරයේ ද විය. ලකුණු 51 - 75 ප්‍රාන්තරයෙහි 26%ක් වූ අතර ලකුණු 76 - 100 දක්වා ප්‍රතිචාර දැක්වූ අපේක්ෂකයන් 8%කි.

ඉහත ප්‍රස්තාරය අනුව iv අනුකොටස සඳහා අයදුම්කරුවන්ගෙන් 77%ක් වූ වැඩිම පහසුතාව දක්වා ඇත. වායු දූෂණය නිසා ඇතිවිය හැකි අහිතකර ප්‍රතිඵල දෙකක් සඳහන් කිරීම පහසු වූයේ කාලීන තොරතුරු පිළිබඳව විෂය දැනුම අපේක්ෂකයන් සතු වූ නිසාය.

මෙම ප්‍රශ්නයේ ix කොටස සඳහාද 69%ක් වූ පහසුතාවක් දක්වා ඇත. යහපත් පුරවැසියෙකු ලෙස ප්‍රගුණ කළ යුතු ගුණාංග දෙකක් සඳහන් කිරීමට අපේක්ෂකයන්ට හැකි විය. ඊට හේතු වූයේ ජීවිතය හා බැඳි යහ පුරුදු පිළිබඳව නිපුණතාව අපේක්ෂකයන් තුළ වර්ධනය වී තිබීමයි.

අයදුම්කරුවන්ට වඩාත්ම පහසුතාව අඩු වී ඇත්තේ vii කොටසය. එහි පහසුතාව 22%කි. ශ්‍රී ලංකාවේ සෑම පළාත් පාලන ආයතනයකටම පොදුවේ පැවරෙන බලතල හා කාර්යයන් පිළිබඳව විමසීමේදී **"පොදුවේ** පැවරෙන බලතල හා කාර්යයන්" යන යෙදුම ගැටලු සහගත වීම එයට හේතු වී ඇත.

මෙම ප්‍රශ්නයේ viii කොටස සඳහා අයදුම්කරුවන් අඩුම පහසුතාවක් දක්වා ඇති අතර එය 16% ක ප්‍රතිශතයකි. ජාත්‍යන්තර වෙළඳාමේ ප්‍රධාන කොටස් දෙක වන ද්විපාර්ශවික හා බහු පාර්ශවික වෙළඳාම ලෙස නම් කිරීමට අවශ්‍ය පාරිභාෂිත වචන පිළිබඳ අනවබෝධය බලපා ඇත.

මෙම ප්‍රශ්නයේ II කොටසේ පහසුතාව 34%කි. මෙම පහසුතාව අඩු වීමට හේතු වූයේ යුක්තිය තුළ අන්තර්ගත ප්‍රධාන කරුණු දෙක සත්‍යය හා සදාචාරය ලෙස නම් කිරීමට අපේක්ෂකයන්ට දුෂ්කර වීමයි. ඊට හේතු වූයේ අදාල න්‍යායාත්මක සංකල්ප පිළිබඳ අවධානය ප්‍රමාණවත් නොවූ නිසාය.

ප්‍රශ්නයේ I කොටසේ පහසුතාව 42%කි. බහු සංස්කෘතික සමාජයක විසරණය සිදුවන ක්‍රම දෙකක් නම් කිරීමට නොහැකි වූයේ විසරණය හා න්‍යායාත්මක සංකල්පයේ අන්තර්ගතය සාධනය නොවූ නිසාය.

ප්‍රශ්නයේ v කොටසේ පහසුතාව 57%කි. සන්ධීය රාජ්‍යයන් යටතේ බලය බෙදා හැර ඇති රටවල් දෙකක් නම් කිරීමට බහුතරයක් අයදුම්කරුවන්ට හැකි විය. 43%ක අයදුම්කරුවන්ට පහසුතාව අඩු වීමට හේතුවක් වූයේ අදාල විෂය කොටස කෙරෙහි ගුරු, සිසු අවධානය ප්‍රමාණවත් නොවූ නිසාය.

ප්‍රශ්නයේ vi කොටසේ පහසුතාව වූයේ 40%කි. ආර්ථික සංවර්ධනය උදෙසා ශ්‍රී ලංකාවේ මෑතදී ක්‍රියාත්මක කරන ලද මහා පරිමාණ ව්‍යාපාර දෙකක් නම් කිරීමට අයදුම්කරුවන්ගෙන් 60%කගේ පහසුතාව අඩු විය. ඊට හේතු වූයේ මෑතදී ක්‍රියාත්මක කරන ලද ' **මහා පරිමාණ ව්‍යාපෘති**' යන්න අවධාරණය කර නොගත් නිසාය. ඒ වෙනුවට ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කරන ලද කුඩා ව්‍යාපෘති පිළිතුරු ලෙස දක්වා තිබිණි.

ප්‍රශ්නයේ x කොටසේ පහසුතාව වූයේ 30%කි. ශ්‍රී ලංකාවට විදේශාධාර ලබා දෙන අන්තර්ජාතික සංවිධාන දෙකක් නම් කිරීමේ පහසුතාව 70%කටම අඩු විය. එයට හේතු වූයේ අන්තර්ජාතික සංවිධාන අතරින් '**විදේශාධාර ලබා දෙන**' සංවිධාන පිළිබඳ සුවිශේෂී අවධානයක් නොදැක්වූ නිසාය.

සමස්තයක් ලෙස ගත් කළ ප්‍රශ්නයේ සියලු කොටස් වලට අදාළ විද්‍යාත්මක පාරිභාෂිත හා න්‍යායාත්මක සංකල්ප හා තොරතුරු ගැන අවධානය යොමු කිරීම වැදගත්ය. ප්‍රශ්න පත්‍රයේ යොදා ඇති සෑම වචනයක් කෙරෙහිම අපේක්ෂකයින්ගේ අවධානය යොමු විය යුතුමය. අයදුම්කරුවන් පෙළපොත අවධානයෙන් කියවීම හා නිරතුරු අභ්‍යාසකරණය කෙරෙහි යොමු විය යුතුය. ගුරුභවතුන්ද ඔවුන් ඊට නැඹුරුවන අභ්‍යාස වලට යොමු කරවිය යුතු අතර කාලීන තොරතුරු පිළිබඳ අත්දැකීම් ලබා දිය යුතුය.

## 02 ප්‍රශ්නය

| (02) අපේක්ෂණය : | ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක ප්‍රධාන අංග ලක්ෂණ හා ගුණාංග පිළිබඳ දැනුම හා විශ්ලේෂණාත්මක අවබෝධය පිරික්සීම. |
|---|---|

**2.** ලෝකයේ බොහෝ රටවල් විවිධ ආකාරයට ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රම ක්‍රියාවට නංවා ඇත.

(i) (a) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කෙරෙන රටක් හා

(b) ව්‍යවස්ථානුගත ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කෙරෙන රටක් පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) රාජ්‍යය හා ආණ්ඩුව යනු ආයතන දෙකකි. රාජ්‍යයක තිබිය යුතු ප්‍රධාන අංග **තුනක්** නම් කරන්න.(ලකුණු 03 යි)

(iii) (a) ආණ්ඩුවක ප්‍රධාන කොටස් **තුන** නම් කරන්න.

(b) ඔබ නම් කළ කොටස් තුන අතුරෙන් **එක්** කොටසකට අයත් කාර්යයන් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(2) (i) (a) නියෝජන ප්‍රජාතාන්ත්‍රවාදය ක්‍රියාත්මක කෙරෙන රටක් :

- බ්‍රිතාන්‍යය / එක්සත් රාජධානිය / එංගලන්තය
- ඊශ්‍රායලය
- නවසීලන්තය

(මින් එක් රටක් නම් කිරීමට = 01යි)

(b) ව්‍යවස්ථානුගත ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කෙරෙන රටක් :

- ඇමරිකා එක්සත් ජනපදය / ඇමරිකාව
- ඉන්දියාව
- ශ්‍රී ලංකාව
- ස්විස්ටර්ලන්තය
- ප්‍රංශය
- ජර්මනිය
- පකිස්ථානය
- බංගලාදේශය

(මින් එක් රටක් නම් කිරීමට = 01යි)

**(I) ලකුණු (a) 1+ (b) 1 = 02**

ii) රාජ්‍යයක ප්‍රධාන අංග :

- භූමිය
- ජනගහනය
- ආණ්ඩුව
- ස්වාධිපත්‍යය

(මින් තුනක් නම් කිරීමට ලකුණු 1×3 =03යි)

(iii) (a) ආණ්ඩුවක ප්‍රධාන කොටස් :

- ව්‍යවස්ථාදායකය
- විධායකය
- අධිකරණය

(b) ආණ්ඩුවේ ප්‍රධාන කොටස් තුනෙන් එකක කාර්යභාරය

<u>ව්‍යවස්ථාදායකය</u>

- නීති පැනවීම, නීති සම්පාදනය හා රාජ්‍ය පාලනය සම්බන්ධව උත්තරීතර ආයතනයයි.
- නීති පැනවීම
- ප්‍රශ්න ඇසීම
- විධායකය පාලනය කිරීම
- මහජන ගැටළු සාකච්ඡා කිරීම
- මුදල් පාලනය
- අය වැය පාලනය

<u>විධායකය</u>

- රටක නීති ක්‍රියාත්මක කරන ආයතනයයි
- රාජ්‍ය සේවය පාලනය කිරීම
- නියෝග හා ආඥා නිකුත් කිරීම
- ත්‍රිවිධ හමුදාව හා පොලිසිය පාලනය කිරීම
- විදේශ සම්බන්ධතා පාලනය කිරීම
- රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීම හා ක්‍රියාවට නැංවීම

<u>අධිකරණය</u>


- යුක්තිය පසිඳලීම
- නීති විවරණය කිරීම
- පුරවැසි අයිතිවාසිකම් ආරක්ෂකයෙකු ලෙස පෙනී සිටීම
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ආරක්ෂකයෙකු ලෙස කටයුතු කිරීම
- උපදේශන කාර්යයන්

ඉහත කොටස් තුනෙන් එකක කාර්යභාරය කෙටියෙන් විස්තර කළ යුතුය.

**iii. (a)** කරුණු තුනම ලියා ඇත්නම් ලකුණු = 02
කරුණු දෙකක් හෝ එකක් නම් කිරීම ලකුණු = 01
**(b)** අවම වශයෙන් කරුණු තුනක් සඳහන් කර තිබේ නම් = 03
එකතුව **(a) 2 + (b) 3 = 05**


2 වන ප්‍රශ්නය පිළිබඳ සමස්ත නිරීක්ෂණ හා නිගමන :

ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය




මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 2 ප්‍රාන්තරයේ 25%ක් ද,
ලකුණු 3 - 5 ප්‍රාන්තරයේ 25%ක් ද,
ලකුණු 6 - 7 ප්‍රාන්තරයේ 22%ක් ද,
ලකුණු 8 - 10 ප්‍රාන්තරයේ 28%ක් ද
ලෙස ලකුණු ලබාගෙන ඇත.

ප්‍රශ්නයේ කොටස් හා අනු කොටස්වල පහසුතාව




2වන ප්‍රශ්නයේ අනුකොටස් අතරින්
(i)(a) කොටස සඳහා පහසුතාව 43%ක් ද,
(i)(b) කොටස සඳහා පහසුතාව 71%ක් ද,
(ii) කොටස සඳහා පහසුතාව 58%ක් ද,
(iii)(a) කොටස සඳහා පහසුතාව 84%ක් ද,
(iii)(b) කොටස සඳහා පහසුතාව 41%ක් ද,
වශයෙන් දැක්විය හැකිය.

ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක ප්‍රධාන අංග ලක්ෂණ හා ගුණාංග පිළිබඳ දැනුම හා විශ්ලේෂණාත්මක අවබෝධය පිරික්සීම සඳහා යොමු කළ මෙම ප්‍රශ්නයේ සමස්ත පහසුතාව 50%කි. I (b) අනුකොටසේත්, III (a) අනුකොටසේත් පහසුතාව පිළිවෙලින් 71%, 84%ක් වූ ඉහළ මට්ටමක පවතී. II කොටස සඳහා පහසුතාව 58%ක් වූ සාමාන්‍ය මට්ටමක් විය.

ලෝකයේ රටවල් වල පවතින පාලන ක්‍රම පිළිබඳ මැන බැලීමට ඉදිරිපත් කර තිබූ I (a), (b) අනුකොටස් වල පහසුතාව පිළිවෙලින් 43%, 71% ප්‍රතිශතයකි. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන රටවල් පිළිබඳ විමසූ I (a) කොටස සඳහා පහසුතාව 43%ක් වැනි අඩු මට්ටමක් පෙන්වීමෙන් පැහැදිලි වන්නේ එම රටවල් පිළිබඳ නිශ්චිත දැනුමක් නොමැති වීමයි. අපේක්ෂකයන් මෙකී ප්‍රශ්නය පැහැදිලිව අවබෝධ කර නොගැනීම මෙයට හේතු වී ඇති බව පෙනේ. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය හා ව්‍යවස්ථානුගත ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳවත් ලිඛිත, අලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පවතින රටවල් පිළිබඳවත් නිරවුල් අවබෝධයක් ලැබෙන සේ නිදසුන් සහිත අභ්‍යාස කරවීම මේ සඳහා සුදුසු වේ.

මෙම ප්‍රශ්නයේ දෙවන කොටස සඳහා පහසුතාව 58%ක් විය. රාජ්‍යයක ප්‍රධාන අංග යන විෂයය කරුණු එම ඒකකයේ පදනම් මාතෘකාව විය. ප්‍රශ්නයට අදාළ පිළිතුරු නිශ්චිත මෙන්ම කෙටි විය යුතුය. අයදුම්කරුවන් සරල විෂයය කරුණු නිවැරදිව ග්‍රහණය කර නොගැනීමෙන් පහසුතාව අඩු මට්ටමක

පැවතිණ. අදාළ මාතෘකාවේ පහසුතාව වැඩිදියුණු කිරීම සඳහා අයදුම්කරුවන් අඛණ්ඩව අභ්‍යාස වල යෙදවීමට ගුරුභවතුන් උත්සාහ කිරීම සුදුසුය. පෙළපොතට අමතරව වෙනත් පොත්පත් පරිශීලනය කිරීමට යොමු කිරීම මෙන්ම සුදුසු පරිදි පාසල් පාදක ඇගයීම් භාවිතයෙන්ද පවතින දුර්වලතාව මඟ හරවා ගත හැකිය.

III (a) කොටස සඳහා අයදුම්කරුවන් ඉහළ කුසලතාවක් පෙන්වා ඇත. එහි පහසුතාව 84%කි. ආණ්ඩුවේ විවිධ ස්ථර පිළිබඳ අයදුම්කරුවන් තුළ නිරවුල් අවබෝධයක් පැවතීම මීට හේතු ලෙස පෙනී යයි.

III (b) කොටස සඳහා පහසුතාව 41%කි. මෙයට හේතු ලෙස පෙනී යන්නේ ආණ්ඩුවේ විවිධ ස්ථර වල කාර්යභාරය පිළිබඳ සිසුන් තුළ පැවති අනවබෝධයයි. ආණ්ඩුවේ විවිධ ස්ථර වල කාර්යභාරය පිළිබඳ පැහැදිලි අවබෝධය අඩු වීමට හේතු වී ඇත්තේ න්‍යායාත්මක දැනුම ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීම පිළිබඳ අයදුම්කරුවන්ට පැහැදිලි වැටහීමක් නොමැති වීමයි. මේ සඳහා පෙළපොත පරිශීලනයට වඩාත් යොමු කරවීමත්, වර්තමාන තත්ත්වයන් පිළිබඳ ගවේෂණ සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා ක්ෂේත්‍ර චාරිකා සඳහා සිසුන් යොමු කිරීමත් වඩාත් යෝග්‍ය වේ.

ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක ප්‍රධාන අංග ලක්ෂණ හා ගුණාංග පිළිබඳ දැනුම හා විශ්ලේෂණාත්මක අවබෝධය පිරික්සීම සඳහා යොමු කළ මෙම ප්‍රශ්නයේ සමස්ත සාධන මට්ටම දෙස බලන විට ලකුණු 0 - 5ත් අතර ලබා ගත් ප්‍රතිශතය 50%ක්ද, 6 - 10ත් අතර ලකුණු ලබා ගත් ප්‍රතිශතය 50%ද වේ. 50%ක් වූ අඩු පහසුතාවක් පෙන්වීමට ප්‍රධාන හේතුව ලෙස පෙනී යන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පිළිබඳ වර්ගීකරණය හා ආණ්ඩුවේ විවිධ ස්ථර වල කාර්යභාරය පිළිබඳ පිළිතුරු ලිවීමේදී අයදුම්කරුවන් දැක් වූ දුර්වලතාවයි. මෙකී ප්‍රශ්නයේ පහසුතාව වර්ධනය කිරීම සඳහා අදාළ ඒකකය පිළිබඳ විශ්ලේෂණාත්මක අවබෝධයක් ලැබෙන ආකාරයේ අභ්‍යාස ලබා දීමද, බාහිර පොත පත ඇසුරු කර ගනිමින් කළ හැකි විවෘත ග්‍රන්ථ පරීක්ෂණ වැනි පැවරුම් ලබා දී ඒවා ඇගයීමට ලක් කර සාකච්ඡා කළ යුතුය.

## 03 ප්‍රශ්නය

| |
|---|
| **(03) අපේක්ෂණය :** බහු සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ හා එවැනි සමාජයක පුරවැසියන්ගේ වගකීම් හා යුතුකම් පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීම |

**3.** ගෝලීයකරණය තුළ බහු සංස්කෘතික සමාජ බිහිවීමේ වැඩි ප්‍රවණතාවක් දක්නට ලැබේ.

(i) බහු සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) අතීතයේ සිට ශ්‍රී ලංකාවේ සියලු ජන කොටස් අන්‍යෝන්‍ය වශයෙන් සහයෝගයෙන් ජීවත් වූ බවට නිදසුන් **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(iii) බහු සංස්කෘතික සමාජයක ජාතීන් අතර සහයෝගීතාවක් ඇති කිරීමට පුරවැසියන් ලෙස අපට ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** සඳහන් කර, ඉන් **එකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(3) (i) බහු සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ

- විවිධ ජන වර්ග, ආගම්, ගෝත්‍ර හෝ කුලවලට අයත් පිරිස් එක් පාලන ඒකකයක් තුළ ජීවත් වීම
- විවිධ භාෂා කථාකරන පුද්ගලයන් සිටීම
- ඒ ඒ සංස්කෘතීන්ට ආවේණික, කැපී පෙනෙන සිරිත් ආචාර ධර්ම හා ඇගයීම් පද්ධතියක් පැවතීම
- එක් එක් සංස්කෘතීන්ට අයත් ජන කොටස් ප්‍රාදේශීය වශයෙන් ඒකරාශී වීමට උත්සාහ දැරීම
- සංස්කෘතික ඒකාබද්ධතාව හා සමෝධානය ඇති කරගත් සමාජ සංවර්ධන ඉලක්ක කරා ළඟා වී සිටීම

**(මෙවැනි ලක්ෂණ දෙකක් සඳහන් කිරීමට ලකුණු 1 + 1 = 02)**

(ii) අතීතයේ සිට ශ්‍රී ලංකාවේ සියළු ජනකොටස් අන්‍යෝන්‍ය සහයෝගයෙන් ජීවත් වූ බවට නිදසුන්

- ත්‍රිකුණාමලය අසල වෙල්ගම් වෙහෙර රාජ රාජ නම් චෝල අධිරාජයාගේ අනුග්‍රහයෙන් පිළිසකර කරවීම
- I විජයබාහු රජුගේ නමින් "විජයරාජ ඊශ්වරම්" නම් ශිව දේවාලයක් කන්තලේ ඉදිකර තිබීම
- යාපහුවේ I වැනි බුවනෙකබාහු රජු මුස්ලිම් දූතයෙකු මිසරයේ සුල්තාන් වෙත යවා තිබීම
- පොලොන්නරුවේ I විජයබාහු රජු සමයේ දළදාව හා ඊට අයත් දේපොල ආරක්ෂා කිරීම පවරා ඇත්තේ " වේලයික්කාර" නම් ද්‍රවිඩ හමුදාවට වීම
- දෙවිනුවර පෙරහැරේ අංගයක් ලෙස වේල් පෙරහැර පැවැත්වීම
- මහනුවර දළදා පෙරහැරට විෂ්ණු, කතරගම, නාථ හා පත්තිනි දේවාල පෙරහැර හතරක් එක්ව තිබීම
- ශ්‍රී ලංකාවට නිදහස ලබා ගැනීමේ සටනට සියලූ ජාතීන්ගේ සහාය ලැබී තිබීම

මෙවැනි නිදසුන් තුනක් දක්වා තිබිය යුතුය.

**(II ලකුණු 1 x 3 = 03යි)**

(iii) බහු සංස්කෘතික සමාජයක ජාතීන් අතර සහයෝගීතාවක් ඇති කිරීමට පුරවැසියන් ලෙස ගත හැකි ක්‍රියාමාර්ග


- එකිනෙකාගේ සංස්කෘතීන්ට හා සිරිත් විරිත්වලට ගරු කිරීම
- අන්‍ය සංස්කෘතීන් ගැන දැන ගැනීම
- විවිධ වාර්ගිකයන්ගේ ආගමික සංස්කෘතික වැඩ සටහන්වලට සහාය දීම.
- අන්‍ය ආගම්වලට අවමන් නොකිරීම
- සියලූ ජාතීන්ගේ සහභාගීත්වය ලබා ගත හැකි වැඩ සටහන් සංවිධානය කිරීම (නිදසුන් :- ක්‍රීඩා, ශ්‍රමදාන හා වෙනත් පොදු කටයුතු)
- අන්‍ය භාෂා ඉගෙනීම හා සාහිත්‍ය කෘති වැනි දෑ අගය කිරීම
- අන්‍ය මත ඉවසීම
- විවිධ සංවර්ධන වැඩසටහන්වලදී සියලූ ජාතීන්ගේ සහභාගීත්වය ලබා ගැනීම
- බෙදී සිටිමෙන් පොදු අරමුණු කරා ළඟාවිය නොහැකි බව අවබෝධ කරදීම
- මිශ්‍ර විවාහ වැනි කරුණුවලදී සහාය දැක්වීම
- සියලූ ජනකොටස්වල දරුවන්ට එකම පාසලක අධ්‍යාපනය ලබා ගැනීමේ ඉඩ පහසුකම් සැලසීම

- විවිධ ජාතීන් අතර ගැටුම් ඇතිවීම වැළැක්වීමට කටයුතු කිරීම
- තමා ජීවත්වන ප්‍රදේශයේ සියලුම ජාතීන්ට සහභාගී විය හැකි ආකාරයේ සමිති හා සංවිධාන පිහිටුවීම (සුබ සාධක සංගම් වැනි)


මේ අදහස දෙන වෙනත් ගැළපෙන කරුණු සඳහා ලකුණු ලබා දෙන්න.
මෙවැනි ක්‍රියාමාර්ග තුනක් නම් කිරීම හා ඉන් එකක් පැහැදිලි කිරීම

**iii.** ලකුණු • ක්‍රියාමාර්ග තුනක් නම් කිරීමට = 03
• එක් ක්‍රියාමාර්ගයක් පැහැදිලි කිරීමට = 02
05

3 වන ප්‍රශ්නය පිළිබඳ සමස්ත නිරීක්ෂණ හා නිගමන




මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 2 ප්‍රාන්තරයේ 21%ක් ද,
ලකුණු 3 - 5 ප්‍රාන්තරයේ 34%ක් ද,
ලකුණු 6 - 7 ප්‍රාන්තරයේ 25%ක් ද,
ලකුණු 8 - 10 ප්‍රාන්තරයේ 20%ක් ද
ලෙස ලකුණු ලබාගෙන ඇත.




3වන ප්‍රශ්නයේ අනුකොටස් අතරින්
(i) කොටස සඳහා පහසුතාව 71%ක් ද,
(ii) කොටස සඳහා පහසුතාව 30%ක් ද,
(iii) කොටස සඳහා පහසුතාව 66%ක් ද,
වශයෙන් දැක්විය හැකිය.

මෙම ප්‍රශ්නයේ පිළිතුරු සඳහා ලකුණු 10ක් හිමි වේ. ප්‍රශ්නය කොටස් තුනකින් යුක්තය.

බහු සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ හා එවැනි සමාජයක පුරවැසියන්ගේ වගකීම හා යුතුකම් පිළිබඳ දැනුම හා අවබෝධය පරීක්ෂා කෙරෙන මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන් ලකුණු හිමි කර ගත් ආකාරය සළකා බැලීමේදී ලකුණු 0 - 2 අතර ලබා ගත් පිරිස 21%ක් ද, ලකුණු 3 - 5 අතර ලබා ගත් පිරිස 34%ක්ද විය. ඒ අනුව අයදුම්කරුවන්ගෙන් 55%කගේ සාධන මට්ටම ලකුණු 5ට අඩුවෙන් සටහන් විය. ලකුණු 6 - 7 අතර ලබා ගත් අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය 25%ක් වූ අතර ලකුණු 8 - 10 අතර ලබා ගත් පිරිස 20%ක් විය. ලකුණු 5ට වඩා වැඩි සාධන මට්ටමක් පෙන්වීමට අයදුම්කරුවන්ගෙන් 45%ක් සමත් වී තිබිණි.

ප්‍රශ්නයේ පළමු කොටස සඳහා අයදුම්කරුවන් දැක්වූ පහසුතාව 71%කි. බහු සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ දෙකක් අපේක්ෂා කළ මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන් බොහෝ පිරිසක් නිවැරදිව පිළිතුරු සපයා තිබිණි. ඊට හේතුව ප්‍රශ්නයේ සරල ස්වභාවයයි.

ප්‍රශ්නයේ දෙවන කොටස සඳහා අයදුම්කරුවන් දැක්වූ පහසුතාව 30%ක් වූ අඩු අගයකි. මෙහිදී අයදුම්කරුවන්ගෙන් අපේක්ෂිත වූයේ අතීතයේ සිට ශ්‍රී ලංකාවේ සියලු ජන කොටස් සහයෝගයෙන් ජීවත් වූ බවට නිදසුන් ඉදිරිපත් කිරීමයි. අයදුම්කරුවන් බොහෝ දෙනෙක් ඒ සඳහා නිදසුන් දැක්වීමට අපොහොසත් විය. කාලීනව වැදගත්කමක් ඇති මෙම මාතෘකාවට අදාළ කරුණු පිළිබඳව සිසුන්ගේ දැනුම ඉතා අඩු බව කැපී පෙනිණි. එසේ වුවද මේ පිළිබඳව සිසුන්ගේ පෙළ පොතෙහි සවිස්තරාත්මකව කරුණු ඉදිරිපත් කර ඇත. සිසුන් මෙවැනි කරුණු ගවේෂණය කොට දැනුම යාවත්කාලීන කර ගත යුතු අතර ගුරුභවතුන්ගෙන් ඒ සඳහා නිසි මගපෙන්වීම ඔවුන්ට ලැබිය යුතුය.

ප්‍රශ්නයේ තෙවන කොටස සඳහා අයදුම්කරුවන් දැක්වූ පහසුතාව 66%කි. අයදුම්කරුවන් බොහෝ දෙනෙකු මෙම ප්‍රශ්නයට සතුටුදායක ලෙස පිළිතුරු සපයා ඇති බව පෙනේ. ප්‍රශ්නය මගින් අපේක්ෂා කර ඇති පරිදි බහු සංස්කෘතික සමාජයක ජාතීන් අතර සහයෝගීතාව ඇති කිරීමට පුරවැසියන් ලෙස ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කිරීමට බොහෝ අයදුම්කරුවන්ට හැකි විය. කාලීන සමාජ අවශ්‍යතා පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුවත් බව ඊට හේතු වූවා විය හැකිය. බහු සංස්කෘතික සමාජයක ජීවත් වන්නන් ලෙස සිසුන් ලද අත්දැකීම් ආශ්‍රයෙන්ද පිළිතුරු පෝෂණය වී තිබිණි. එසේ වුවද අයදුම්කරුවන්ගෙන් 34% පිරිසක් මෙම ප්‍රශ්නයට සාර්ථකව පිළිතුරු දී නොතිබිණි. ඔවුන්ට සිය අත්දැකීම් තුළින් දැනුම පෝෂණය කිරීමටත්, එම දැනුම භාවිතය හා විශ්ලේෂණය කිරීමටත් ගුරුභවතුන් මඟ පෙන්විය යුතුය.

මෙම ප්‍රශ්නය සඳහා ඉහළ ලකුණු මට්ටමක් ලබා ගැනීමට අයදුම්කරුවන්ට මඟ පෙන්වීමේදී විෂය ඒකකයේ සියලු කරුණු අධ්‍යයනයට යොමු කෙරෙන ආකාරයට අභ්‍යාස කරවීම කළ යුතුය. විවිධ ජාතීන්ගේ උත්සව පැවැත්වීම, ජාතීන් අතර සහයෝගීතාව වර්ධනය වන ප්‍රායෝගික ක්‍රියාකාරකම් සිදු කිරීම, ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කොට විවිධ ජාතීන්ගේ උත්සව නැරඹීමට යාම, ඔවුන්ට උපකාර කිරීම ආදී ක්‍රමවේද ගුරුභවතුන්ට සිදු කළ හැකි කාර්යයන්ට උදාහරණ කීපයකි. අයදුම්කරුවන්ද පෙළපොත ආශ්‍රිත විෂය කරුණු මැනවින් ග්‍රහණය කර ගත හැකි ආකාරයේ ප්‍රශ්න සකසමින් විභාගය සඳහා පෙර සූදානම පවත්වා ගැනීම කළ යුතුය.

## 04 ප්‍රශ්නය

| | |
|---|---|
| (04) අපේක්ෂණය : | ලෝකයේ විවිධ අර්ථ ක්‍රමවල ස්වභාවය, ඒවායේ ගුණාංග හා ගෝලීයකරණය නිසා ලෝක ආර්ථිකයට සිදු වී ඇති වෙනස්කම් පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීම. |

4. ආර්ථිකයක් සතු සම්පත්වල හිඟකම තුළින් පැන නගින මූලික ආර්ථික ප්‍රශ්නවලට මුහුණ දීමට සෑම ආර්ථිකයකට ම සිදු වේ.

(i) හිඟකම තුළින් පැන නගින මූලික ආර්ථික ප්‍රශ්න **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) ධනවාදී අර්ථක්‍රමයක් තුළ දක්නට ලැබෙන අයහපත් ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාවට අත් වී ඇති යහපත් ප්‍රතිඵල **තුනක්** සඳහන් කර ඉන් **එකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(4) (i) හිඟකම තුළින් පැන නගින මූලික ආර්ථික ප්‍රශ්න

- කුමක් කොපමණ නිපදනවාද ?
- කෙසේ කවුරුන් නිපදවනවාද ?
- කවුරුන් සඳහා නිපදනවාද ?

නිපදවනවාද යන්න ලියා නැතත් ලකුණු ලබා දෙන්න

මින් දෙකක් සඳහන් කිරීමට I ලකුණු 1+1 = 02

(ii) ධනවාදී අර්ථක්‍රමයක අයහපත් ලක්ෂණ

- ලාභ ලැබීමේ අරමුණ මූලික කරගෙන භාණ්ඩ නිපදවීම
- ආර්ථික කටයුතු පෞද්ගලික අයිතිය යටතේ පවතින හෙයින් සම්පත් බෙදීයාමේ අසමානතාවක් පැවතීම
- විවිධ ප්‍රචාරණ ක්‍රම උපයෝගී කර ගනිමින් භාණ්ඩ අළෙවිකර ගැනීම සඳහා පාරිභෝගිකයාව පොළඹවා ගැනීම
- නිෂ්පාදන මිලදී ගැනීමට හැකියාව ඇති පාර්ශව සඳහා භාණ්ඩ නිපදවීම
- සෘණ බාහිරතා පිළිබඳ අවධානය යොමු නොකිරීම

මෙවැනි ලක්ෂණ තුනක් සඳහන් කිරීමට II ලකුණු 1 × 3 = 03


(iii) ගෝලීයකරණය නිසා ලංකාවට අත් වී ඇති යහපත් ප්‍රතිඵල

- විදේශීය වෙළෙඳපොල තුළට කර්මාන්ත අංශය යොමු වීම නිසා විදේශීය තාක්ෂණය හා ආයෝජන ගලා ඒම
- දේශීය සම්පත් ප්‍රයෝජනයට ගැනීමේ අවස්ථාව උදාවීම හා සේවා වියුක්තියට විසඳුම් ලැබීම
- දේශීය කෘෂි නිෂ්පාදන සඳහා නව වෙළෙඳපොල සොයා ගැනීමට අවස්ථාව ලැබීම හා විදේශ විනිමය ඉහළ යාම
- බුද්ධිමතුන් සඳහා විවිධ නව රැකියා අවස්ථා උදාවීම
- කලාපීය වෙළෙඳ ගිවිසුම් හා සංවිධාන තුළ ක්‍රියාත්මක වන නිදහස් තීරුබදු ප්‍රතිපත්ති මත භාණ්ඩ හුවමාරුවට අවස්ථාව ලැබීම නිසා ව්‍යාපාරිකයන්ට වැඩි පහසුකම් ලැබීම
- දේශීය වෙළෙඳපොලේ නව තාක්ෂණික මෙවලම්, උපකරණ හා භාණ්ඩ සුලභවීම නිසා දේශීය පරිභෝජන රටාවන් වෙනස්වීම හා භාණ්ඩ මිල ගණන් එයට සාපේක්ෂව පහළ වැටීම


- නව තාක්ෂණික උපකරණ හා සන්නිවේදන අංශයේ සීඝ්‍ර දියුණුව නිසා දෙස් විදෙස් සම්බන්ධතා වැඩි වී ඇත.
- නව අධ්‍යාපන අවස්ථා ලැබී ඇත.
- නිවසේ සිට අන්තර්ජාලය ඔස්සේ ඉගෙන ගැනීමට හැකි වී ඇත.
- යටිතල පහසුකම් පුළුල් වීම හා ජනතාවගේ ජීවන තත්වය ඉහළ යාම

**iii.** ලකුණු • මෙවැනි කරුණු තුනක් නම් කිරීමට = 03
• එකක් පැහැදිලි කිරීමට = 02
05

**4 වන ප්‍රශ්නය පිළිබඳ සමස්ත නිරීක්ෂණ හා නිගමන**




මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 2 ප්‍රාන්තරයේ 41%ක් ද,
ලකුණු 3 - 5 ප්‍රාන්තරයේ 27%ක් ද,
ලකුණු 6 - 7 ප්‍රාන්තරයේ 14%ක් ද,
ලකුණු 8 - 10 ප්‍රාන්තරයේ 18%ක් ද
ලෙස ලකුණු ලබාගෙන ඇත.




4 වන ප්‍රශ්නයේ අනුකොටස් අතරින්
(i) කොටස සඳහා පහසුතාව 43%ක් ද,
(ii) කොටස සඳහා පහසුතාව 34%ක් ද,
(iii) කොටස සඳහා පහසුතාව 49%ක් ද,
වශයෙන් දැක්විය හැකිය.

ලෝකයේ විවිධ අර්ථ ක්‍රම වල ස්වභාවය, ඒවායේ ගුණාංග හා ගෝලීයකරණය නිසා ලෝක ආර්ථිකයට සිදු වී ඇති වෙනස්කම් පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීම අපේක්ෂණය වූ මෙම ප්‍රශ්නයේ I කොටසෙහි පහසුතාව 43%කි. ඒ අනුව 57%ක පහසුතාව අඩු බවක් පෙන්නුම් කෙරේ. වැඩි ප්‍රතිශතයක් අඩු පහසුතාවක් පෙන්නුම් කිරීමට හේතු වූයේ මූලික ආර්ථික ප්‍රශ්න පිළිබඳව පවතින අඩු අවබෝධයත්, ප්‍රශ්නය අවබෝධ කර ගැනීමේ දුර්වලතාවයත්ය. ගුරුභවතුන් විසින් පෙළපොත අවධාරණය කරමින් දැනුම ගවේෂණය සඳහා අයදුම්කරුවන් යොමු කළේ නම් මේ තත්ත්වය මඟ හරවා ගැනීමට හැකි වනු ඇත.

ප්‍රශ්නයේ II කොටස සඳහා පහසුතාව 34%කි. ඒ අනුව මෙම කොටසේ පහසුතාව අඩු බව 66%ක් වැනි ඉහළ ප්‍රතිශතයකි. අයදුම්කරුවන්ට ධනවාදී අර්ථක්‍රමය පිළිබඳවත් එහි ලක්ෂණ යහපත්, අයහපත් ලෙස වර්ගීකරණය කර ගැනීමේ අවබෝධයක් හා හැකියාවක් නොවීය. වෙළඳපොළ ආර්ථික සංකල්පය හා ධනවාදී අර්ථක්‍රමයේ අන්තර්ගතය පිළිබඳ පැහැදිලි අවබෝධයක් අයදුම්කරුවන්ට නොවීය. ලබා ගත් දැනුම උචිත ලෙස භාවිත කිරීමේ දුර්වලතාවයද ප්‍රබල ලෙස බලපා ඇත. මේ කරුණු වටහා ගෙන කටයුතු කිරීම ගුරු භවතුන්ගේ වගකීම වන්නේය.

ප්‍රශ්නයේ III කොටසේ පහසුතාව 49%කි. ඒ අනුව 51%ක පහසුතාව අඩු බවක් පෙන්නුම් කරයි. ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාවට අත් වී ඇති යහපත් ප්‍රතිඵල පිළිබඳව අවශ්‍ය තරම් කරුණු පෙළපොතේ අන්තර්ගතය. ඒ හැරුණු විට විවිධ සන්නිවේදන මාධ්‍යය තුළින්ද මෙම කරුණු සාකච්ඡා කෙරේ. එහෙත් අයදුම්කරුවන් මේ පිළිබඳව වැඩි අවධානයක් යොමු කර නැති බව පෙනේ. පෙළපොත පරිශීලනය, කාලීන තොරතුරු ඇතුළත් පුවත්පත්, සඟරා වැනි මාධ්‍යයන්ට යොමු වී කරුණු රැස් කර ගත හැකි ආකාරයේ මඟ පෙන්වීමක් ගුරු භවතුන් විසින් කළ යුතුය. අයදුම්කරුවන්ද එම මඟ පෙන්වීමෙන් පෝෂණය ලබා ගත යුතුය.

මේ ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන් ලකුණු හිමි කර ගත් ආකාරය සළකා බැලිමේදී ලකුණු 0 - 2 අතර 41%ද, ලකුණු 3 -5 අතර 27%ද විය. ඒ අනුව අයදුම්කරුවන්ගෙන් 68%ක්ම ලකුණු 5ට අඩුවෙන් ලබා ගෙන ඇත. ප්‍රශ්නයේ I හා II කොටස් වල අඩු සාධන මට්ටම ඊට හේතු විය. ලකුණු 6 -7 අතර 14%ක ප්‍රතිශතයක්ද, ලකුණු 8 -10 අතර 18%ක් ලෙසද අයදුම්කරුවන්ගෙන් 32%ක් පමණක් ලකුණු 5ට වැඩියෙන් හිමි කරගෙන තිබිණි. ප්‍රශ්නයේ III කොටසේ පහසුතාව ඊට හේතු විය.

ප්‍රශ්නය සඳහා ඉහළ ලකුණු මට්ටමක් ලබා ගැනීමට අයදුම්කරුවන්ට මඟ පෙන්වීමේදී විෂය ඒකකයේ විෂය කරුණු රසවත්ව ග්‍රහණය කර ගත හැකි ඉගැන්වීම් ක්‍රම ගුරු භවතුන් විසින් භාවිත කළ යුතුය. මාධ්‍ය සාකච්ඡා, විවාද, රංගන අවස්ථා නිරූපණය ඊට උදාහරණ කීපයක් ලෙස දැක්විය හැකිය. විෂය කරුණු වල අඛණ්ඩ සබඳතාවය පවත්වා ගනිමින් කරුණු වල ගලා යාම පවත්වා ගැනීමද වැදගත්ය. රසවත් ඉගෙනුම් අවස්ථා සඳහා මනා සහභාගීත්වය ලබා ගනිමින් ඒකකය මැනවින් අධ්‍යයන කිරීම අයදුම්කරුවන් විසින් කළ යුත්තේය.

## 05 ප්‍රශ්නය

| (05) අපේක්ෂණය : | ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන අධිකරණ පද්ධතියෙහි ස්වභාවය පිළිබඳ විශ්ලේෂණාත්මක අවබෝධය මැනීම |
|---|---|

5. රටක නීතිය නිසි පරිදි ක්‍රියාත්මක වේ නම් එම සමාජය ද නීති ගරුක වේ.
   (i) ශ්‍රී ලංකාවේ දේශීය නීතියට අමතරව ක්‍රියාත්මක වන වෙනත් නීති වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
   (ii) ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධිකරණ ආයතනවලට අමතරව විශේෂ කාර්යයන් පදනම් කර ගෙන පිහිටුවා ඇති අධිකරණ ආයතන **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)
   (iii) අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ගෙන ඇති පියවර **තුනක්** සඳහන් කර, ඉන් **එකක්** පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 05 යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(5) (i) ශ්‍රී ලංකාවේ දේශීය නීතියට අමතරව ක්‍රියාත්මක වන වෙනත් නීති වර්ග

- උඩරට නීතිය
- තේසවලමෙයි නීතිය
- මුස්ලිම් නීතිය

මින් දෙකක් සඳහන් කිරීමට I ලකුණු 1+1 = 02

(ii) ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධිකරණ ආයතනවලට අමතරව විශේෂ කාර්යයන් පදනම් කරගෙන පිහිටුවා ඇති අධිකරණ ආයතන

- කම්කරු විනිශ්චය සභා
- කාති උසාවි
- ගෙවල් කුලී මණ්ඩලය
- යුද්ධාධිකරණය


(මෙම ආයතනවලින් තුනක් නම් කිරීමට II ලකුණු 1 × 3 = 03)

(iii) අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් යොදා ඇති විධි විධාන


- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව විනිශ්චයකාරවරුන් පත් කිරීම
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව විනිශ්චයකාරවරුන් ඉවත් කිරීම
- විනිශ්චයකාරවරුන්ගේ වැටුප් රජයේ ඒකාබද්ධ අරමුදලින් ගෙවීම හා සේවා කාලය තුළ වැටුප් අඩු කළ නොහැකි වීම
- විනිශ්චයකාරවරුන්ට වෙනත් ආදායම් ඉපයීමේ කාර්යයක නිරතවිය නොහැකි වීම
- අධිකරණ සේවා කොමිෂන් සභාවක් පත් කිරීම
- අධිකරණයට අනවශ්‍ය මැදිහත්වීම් හා බලපෑම් කිරීම දඬුවම් කළ හැකි වරදක් වීම

මෙවැනි කරුණු තුනක් නම් කිරීමට ලකුණු = 03
එක් කරුණක් විස්තර කිරීමට ලකුණු = 02
05

**5 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ හා නිගමන**




මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 2 ප්‍රාන්තරයේ 63%ක් ද,
ලකුණු 3 - 5 ප්‍රාන්තරයේ 17%ක් ද,
ලකුණු 6 - 7 ප්‍රාන්තරයේ 10%ක් ද,
ලකුණු 8 - 10 ප්‍රාන්තරයේ 10%ක් ද
ලෙස ලකුණු ලබාගෙන ඇත.




5 වන ප්‍රශ්නයේ අනුකොටස් අතරින්
(i) කොටස සඳහා පහසුතාව 66%ක් ද,
(ii) කොටස සඳහා පහසුතාව 15%ක් ද,
(iii) කොටස සඳහා පහසුතාව 26%ක් ද,
වශයෙන් දැක්විය හැකිය.

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන අධිකරණ පද්ධතියෙහි ස්වභාවය පිළිබඳ විශ්ලේෂණාත්මක අවබෝධය මැනීම සඳහා යොමු කර ඇති මෙම ප්‍රශ්නයෙහි පළමු කොටස සඳහා පහසුතාව 66%කි. එය සතුටුදායක මට්ටමකි. දෙවන කොටස සඳහා 15%ක් සහ තුන්වන කොටස සඳහා 26%ක් වූ අඩු පහසුතාවක් පෙන්නුම් කරයි.

ශ්‍රී ලංකාවේ දේශීය නීතියට අමතරව ක්‍රියාත්මක වන නීති වර්ග පිළිබඳව විමසූ පළමු කොටස සඳහා අයදුම්කරුවන් 66%ක පහසුතාවක් පෙන්වා ඇත. නීති වර්ග පිළිබඳව අයදුම්කරුවන් තුළ දැනුවත්භාවය මෙම සතුටුදායක මට්ටමට හේතු වී ඇත. පෙළපොත පරිශීලනයට තවදුරටත් සිසුන් යොමු කිරීමෙන් සහ අභ්‍යාසකරණයෙන් මෙය තවදුරටත් වර්ධනය කර ගත හැකිය.

දෙවන කොටසින් විමසූ විශේෂ කාර්යයන් පදනම් කරගෙන පිහිටුවා ඇති ආයතන හැඳින්වීමේදී අපේක්ෂකයන් දැක්වූ පිළිතුරු වල පහසුතාව 15%කි. එය ඉතාමත් අඩු ප්‍රතිශතයකි. විශේෂ කාර්යයන් පදනම් කරගත් අධිකරණ ආයතන පිළිබඳ සිසුන්ගේ මතකය හා අවබෝධය අඩු බව මේ සඳහා හේතු වී ඇති බව පැහැදිලි වේ. පෙළපොතෙහි මේ පිළිබඳව කරුණු සටහන් වුවද පහසුතාව අඩු වී ඇත්තේ උදාහරණ ඇසුරින් ඒ පිළිබඳව වටහා නොගැනීම බව පෙනී යයි. පෙළපොතේ අදාළ ඒකකය පිළිබඳව සාකච්ඡා කිරීමේදී නිදසුන් ඇසුරු කර ගනිමින් සාකච්ජාව මෙහෙයවීමත්, නිරන්තර අභ්‍යාසකරණයත් මේ සඳහා ගත හැකි පිළියම් ලෙස දැක්විය හැකිය.

අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ගෙන ඇති පියවර පිළිබඳ විමසූ තුන්වන කොටස සඳහා පහසුතාව 26%කි. එය ඉතා අඩු ප්‍රතිශතයකි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා අධිකරණ ආයතන පිළිබඳ අපේක්ෂකයන්ගේ අවබෝධය ඉතා අඩු බව පැහැදිළි විය. මේ පිළිබඳව සිසු අවධානය වැඩි වශයෙන් යොමු කරවීම ගුරු භවතුන්ගේ වගකීමක් වන අතර ඒ සඳහා අවශ්‍ය මඟ පෙන්වීමට සුදුසු අන්දමේ ක්‍රියාකාරකම් හා ප්‍රතිකාර්ය වැඩසටහන් ක්‍රියාත්මක කරවීම වැදගත් වේ.

ප්‍රශ්නයේ සමස්තය පිළිබඳ සළකා බැලීමේදී අයදුම්කරුවන්ගෙන් 80%ක්ම ලබා ඇත්තේ ලකුණු 0 - 5 ත් අතර වූ අඩු ප්‍රමාණයකි. ඒ අතුරින් ලකුණු 0 - 2 ත් අතර ප්‍රමාණය 63%කි. ලකුණු 6 - 10 ත් අතර ලකුණු ප්‍රාන්තරයේ සිටි අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය 20%කි.

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන අධිකරණ පද්ධතියෙහි ස්වභාවය පිළිබඳ විශ්ලේෂණාත්මක අවබෝධයක් අපේක්ෂකයන් තුළ නොමැති බව පැහැදිලිව පෙනී ගිය කරුණකි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා අධිකරණ ආයතන පිළිබඳව විමර්ශනය කරමින් පිළිතුරු ලිවීම සඳහා අභ්‍යාස ලබා දී ඒවා ඇගයීම හා සාකච්ඡා කිරීම ද, ක්ෂේත්‍ර චාරිකා මඟින් දැනුම තහවුරු කර ගැනීමේ අවස්ථා ලබා දීම මඟින්ද මෙබඳු ප්‍රශ්න වලට සාර්ථකව පිළිතුරු සැපයීමේ කුසලතාව සිසුන් තුළ වර්ධනය කළ හැකිය.

## 06 ප්‍රශ්නය

| | |
|---|---|
| **(06) අපේක්ෂණය :** | **මානව අයිතිවාසිකම්වල වැදගත්කම හා ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීම** |

**6.** සෑම මනුෂ්‍යයකුට ම තිබිය යුතුයැයි සැලකෙන හිමිකම් මානව අයිතිවාසිකම් නම් වේ.

(i) මිනිස්සු තම අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා විවිධ අරගලවල නිරත වූ බව ඉතිහාසයෙහි සඳහන් වේ. එසේ අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා කටයුතු කළ අවස්ථා **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) සිඩෝ (CEDAW) සම්මුතියට අනුව කාන්තාවන්ට හිමි අයිතිවාසිකම් කොටස් කිහිපයක් යටතේ පෙළගස්වා ඇත. ඉන් කොටස් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(iii) (a) ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග **තුනක්** සඳහන් කරන්න.

(b) ළමා අයිතිවාසිකම් කඩවන අවස්ථාවක් නිදසුන් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(6) (i) මිනිසා අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා කටයුතු කළ අවස්ථා

- ක්‍රි:ව: 1215 මැග්නාකාර්ටා ගිවිසුම
- ක්‍රි:ව: 1679 හබයාස් කෝපුස් ආඥාව
- ක්‍රි:ව: 1689 බ්‍රිතාන්‍යයේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය
- ක්‍රි:ව: 1776 ඇමරිකානු නිදහස් ප්‍රකාශනය / නිදහස් සටන
- ක්‍රි:ව: 1789 මිනිස් හා පුරවැසියන් පිළිබඳ ප්‍රංශ ප්‍රකාශනය
- ක්‍රි:ව: 1791 අයිතිවාසිකම් පිළිබඳ ඇමරිකානු ප්‍රඥප්තිය
- ක්‍රි:ව: 1917 රුසියන් විප්ලවය
- ක්‍රි:ව: 1948 මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය
- චීන විප්ලවය, ඉංග්‍රීසි විප්ලවය, ප්‍රංශ විප්ලවය **(වර්ෂ නැතත් ලකුණු ලබා දෙන්න)**

(ii) සිඩෝ සම්මුතියේ කාන්තා අයිතිවාසිකම් පෙළගස්වා ඇති කොටස් :

- කාන්තාවන්ගේ දේශපාලන හා සිවිල් අයිතිවාසිකම්
- පවුල් ඒකකය තුළ කාන්තාවන්ගේ අයිතිවාසිකම්
- අධ්‍යාපනයට හා පුහුණුවීමට ඇති අයිතිය
- ආර්ථික කටයුතුවලට හා එහි ප්‍රතිලාභවලට ඇති අයිතිය
- සෞඛ්‍යාරක්ෂාවට හා පෝෂණයට ඇති අයිතිය
- සමාජ වෙනස්කම්වලින් ආරක්‍ෂා වීමේ අයිතිය

**මේවායින් තුනක් නම් කිරීම II ලකුණු 1 × 3 = 03**

(iii)(a) ළමා අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීමට ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග

- ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය පිළිගෙන ක්‍රියාත්මක කිරීම
- ශ්‍රී ලංකාවේ නීති සකසන විට ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සැළකිල්ලට ගෙන නීති සම්පාදනය කිරීම
- ළමයින් සම්බන්ධයෙන් ක්‍රියාකිරීම සඳහා ළමා ආරක්‍ෂණ අධිකාරිය පිහිටුවා පවත්වාගෙන යාම හා බලය පැවරීම
- සැම පොලිසියකම ළමයින් හා කාන්තාවන්ට අදාළ පැමිණිලි විභාග කිරීමට ළමා හා කාන්තා කාර්යාංශයක් පිහිටුවීම
- 1993 - 1998 දණ්ඩ නීති සංග්‍රහයට ඇති කළ සංශෝධන මඟින් එතෙක් පැවති නීතියට අවශ්‍ය වෙනස්කම් ඇති කිරීම

**මෙවැනි ක්‍රියා මාර්ග තුනක් සඳහන් කිරීම**


**(b)** ළමා අයිතිවාසිකම් කඩවන අවස්ථාවක් නිදසුන් දක්වමින් විස්තර කිරීම

- ළමයින් මෙහෙකාරකමෙහි යෙදවීම
- ළමයින් යුදමය කාර්යයන්හි යෙදවීම
- ළමයින් රැකියාවන් හි යෙදවීම
- ළමයින් අපචාරවලට යොමු කිරීම
- ළමයින්ට වදහිංසා පැමිණවීම


මෙවැනි අවස්ථාවක් ගෙනහැර දක්වමින් ඒ මඟින් ළමා අයිතිවාසිකම් කඩවී ඇති ආකාරය විස්තර කිරීම

**III ලකුණු (a) 3 + (b) 2 = 05**

### 6 වන ප්‍රශ්නය පිළිබඳ සමස්ත නිරීක්ෂණ හා නිගමන




මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 2 ප්‍රාන්තරයේ 33 %ක් ද,
ලකුණු 3 - 5 ප්‍රාන්තරයේ 36%ක් ද,
ලකුණු 6 - 7 ප්‍රාන්තරයේ 16 %ක් ද,
ලකුණු 8 - 10 ප්‍රාන්තරයේ 15%ක් ද
ලෙසින් ලකුණු ලබාගෙන ඇත.




6 වන ප්‍රශ්නයේ අනුකොටස් අතරින්
(i) කොටස සඳහා පහසුතාව 40%ක් ද,
(ii) කොටස සඳහා පහසුතාව 32%ක් ද,
(iii) කොටස සඳහා පහසුතාව 50%ක් ද,
වශයෙන් දැක්විය හැකිය.

මානව අයිතිවාසිකම් වල වැදගත්කම හා ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කෙරෙහි අවධානය යොමු කරවූ මෙම ප්‍රශ්නයේ I කොටසේ පහසුතාව 40%කි. අපේක්ෂකයින්ගෙන් 60%ක් ඊට නිසි ප්‍රතිචාර දැක්වීමේ පහසුතාව ලබා නැත. මෙම ඒකකය ආරම්භයේදීම පෙළපොතේ සඳහන් කරුණු වුවද, සිසු අවධානය ඊට යොමු නොවීම එයට හේතුව විය.

දෙවන කොටසේ නිවැරදි පිළිතුර ඉදිරිපත් කිරීමේ අපේක්ෂක ප්‍රතිශතය 32%කි. ඒ අනුව 68%ක් අඩු පහසුතාවක් දක්වා ඇත. එය නිවැරදි පිළිතුරු දැක්වීමේ දැඩි අපහසුතා මට්ටමක් විය. අයිතිවාසිකම් වර්ගීකරණයේ පහසුතාව වර්ධනය විය යුතුය. ඒ සඳහා පෙළපොත ආශ්‍රිත ප්‍රශ්නෝත්තර ක්‍රමය උපයෝගී කරගත් අභ්‍යාසකරණය, සාකච්ඡාව හා නිරන්තර ඇගයීමට ගුරු - සිසු දෙපාර්ශවයේම අවධානය යොමු විය යුතුය.

තෙවන කොටසේ පහසුතාව 50%කි. එම කොටසේ ස්වභාවය අනෙක් ප්‍රශ්න වලට සාපේක්ෂව වෙනස්ය. එහි a, b කොටස් දෙකකි. ශ්‍රී ලංකාව ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කෙරෙහි යොමු කරවා ඇත. මෙහි a කොටසේ නීතිමය කරුණු වලින් අපේක්ෂකයින් බැහැර වී ඇත. එහි b කොටසේ කාලීන තොරතුරු වලින් විස්තර කිරීම නිසා 50%ක පහසුතාව ලබා ඇත.

සමස්ත ලකුණු ලබා ගැනීමේ ආකාරය අනුව ලකුණු 8 - 10 ප්‍රාන්තරයේ රැඳී සිටින්නේ 15%කි. අපේක්ෂකයින්ගෙන් 33%ක් ලබා ඇත්තේ ලකුණු 0 - 2 ප්‍රාන්තරයයි. 3 - 5 ප්‍රාන්තරයේ 36% ද, ලකුණු 6 - 7 ප්‍රාන්තරයේ 16%ක්ද විය. ඒ අනුව ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ ප්‍රතිශතය 31%කි. ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ අපේක්ෂක ප්‍රතිශතය 69%ක් වීම අසතුටුදායක තත්ත්වයක් විය.

6 ප්‍රශ්නයට අදාළ ඒකකය වර්තමානයේ අතිශයින් වැදගත්ය. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත්විට මූලික අයිතිවාසිකම්, කාන්තා හා ළමා අයිතිවාසිකම් කෙරෙහි පුරවැසියෙකු ලෙස අනිවාර්යයෙන්ම අවධානය යොමු විය යුතුමය. අයිතිවාසිකම් වලට ගරුත්වය හිමි වන්නේ එය දිනා ගැනීමේ ලා ඉතිහාසයේ දැරූ ප්‍රයත්නයන් නිසාම බව අපේක්ෂකයන් තුළ තහවුරු විය යුතුය. අදාළ නෛතික, සමාජ, අත්දැකීම් ගැන කාලීනව ශ්‍රී ලංකාවේ පවත්නා කාන්තා හා ළමා පීඩනය ගැනත් සාකච්ඡා විය යුතුය. ක්‍රියාකාරකම් වලට අදාළ අභ්‍යාස කිරීමද සිදු විය යුතුය.

## 07 ප්‍රශ්නය

| | |
|---|---|
| **(07) අපේක්ෂණය :** | **පරිසරය හා මිනිස් කටයුතු අතර ඇති සබඳතාව හා පරිසර සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීම** |

**7.** **පෘථිවි තලයේ වාසය කරන මිනිසා ඇතුළු සියලු ම ජීවීන් වර්තමානයේ මුහුණපා ඇති ප්‍රධානත ම ගැටලුවක් වන්නෙ පරිසර දූෂණයයි.**

(i) **පාරිසරික ගැටළු පැන නැඟීමට හේතු වන,**

(a) **මිනිස් ක්‍රියාකාරකමක් හා**

(b) **ස්වාභාවික සංසිද්ධියක් පිළිවෙළින් සඳහන් කරන්න.** (ලකුණු 02 යි)

(ii) **වර්තමානයේ වැඩි අවධානයක් යොමු වී ඇති පාරිසරික ගැටලු තුනක් සඳහන් කරන්න.** (ලකුණු 03 යි)

(iii) **පාරිසරික ගැටලු අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග තුනක් සඳහන් කොට, ඉන් එකක් පැහැදිලි කරන්න.** (ලකුණු 05 යි)

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(7) (i) (a) පරිසර ගැටලු පැන නැඟීමට හේතුවන මිනිස් ක්‍රියාකාරකමක්

- වන විනාශය
- අක්‍රමවත් කැලි කසල බැහැර කිරීම
- කම්හල්වලින් පිට කෙරෙන අපද්‍රව්‍ය හා විෂ වායු වර්ග
- ජලය දූෂණය කෙරෙන ක්‍රියා - කෘමිනාශක, වල්නාශක ජලයට මුසුවීම
- අක්‍රමවත් කෘෂිකාර්මික ක්‍රම
- අක්‍රමවත් ලෙස ඛනිජ සම්පත් භාවිතය

මෙවැනි කටයුතු ආශ්‍රිත මිනිස් ක්‍රියාකාරකමක් නම් කිරීම

(b) පාරිසරික ගැටලු පැන නැඟීමට හේතුවන ස්වාභාවික සංසිද්ධියක්

- සුළි සුළං
- ගිනි කඳු පිපිරීම
- සුනාමි හට ගැනීම
- භූමි කම්පා හට ගැනීම
- ලැව් ගිනි
- ජල ගැලීම්
- නාය යෑම්

මෙවැනි සංසිද්ධියක් නම් කිරීම I ලකුණු (a) 1 + (b) 1 = 02

(ii) වර්තමානයේ වැඩි අවධානයක් යොමු වී ඇති පාරිසරික ගැටලු

- ජෛව සම්පත් හායනය
- වායු ගෝලය උණුසුම් වීම
- දේශගුණ විපර්යාස
- ඕසෝන් වියන තුනී වීම
- අම්ල වැසි
- පාරිසරික සෞඛ්‍ය තර්ජන
- වායු දූෂණය
- සමුද්‍ර දූෂණය
- ජල දූෂණය
- ගොඩබිම් දූෂණය


**මෙවැනි ගැටලු තුනක් නම් කිරීමට ලකුණු $1 \times 3 = 03$**

(iii) පාරිසරික ගැටලු අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග


- පරිසර හිතකාමී ආකල්ප වර්ධනය කිරීම
- කැලි කසල හා අපද්‍රව්‍ය ක්‍රමවත් ලෙස බැහැර කිරීම
- ජලය දූෂණය වන කටයුතුවලින් වැළකීම
- වන විනාශය වැළැක්වීම
- කෘෂිකාර්මික ක්‍රම විධිමත් කිරීම
- ජල ගැලීම් වැළැක්වීමේ ක්‍රියාමාර්ග
- නායයෑම් වැළැක්වීමේ ක්‍රියාමාර්ග
- ස්වාභාවික සම්පත් භාවිතයේ දී පරිසරයට වන හානි වැළැක්වීම
- රසායනික පෙහොර, කෘමිනාශක, වල්නාශක භාවිතය අවම කිරීම වැනි

**ක්‍රියාමාර්ග තුනක් නම් කිරීම ලකුණු - 03**
**එක් ක්‍රියාමාර්ගයක් පැහැදිලි කිරීමට ලකුණු - 02**
**05**

## 7 වන ප්‍රශ්නය පිළිබඳ සමස්ත නිරීක්ෂණ හා නිගමන




මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 2 ප්‍රාන්තරයේ 8%ක් ද,
ලකුණු 3 - 5 ප්‍රාන්තරයේ 22%ක් ද,
ලකුණු 6 - 7 ප්‍රාන්තරයේ 24%ක් ද,
ලකුණු 8 - 10 ප්‍රාන්තරයේ 46%ක් ද
ලෙස ලකුණු ලබාගෙන ඇත.




7 වන ප්‍රශ්නයේ අනුකොටස් අතරින්
(i) (a) කොටස සඳහා පහසුතාව 95%ක් ද,
(b) කොටස සඳහා පහසුතාව 81%ක් ද,
(ii) කොටස සඳහා පහසුතාව 64%ක් ද,
(iii) කොටස සඳහා පහසුතාව 71%ක් ද,
වශයෙන් දැක්විය හැකිය.

පරිසරය හා මිනිස් කටයුතු අතර සබඳතාව හා පරිසර සංරක්ෂණයේ වැදගත්කම තේමා කරගත් මෙම ප්‍රශ්නයේ I කොටසේ නිවැරදි පිළිතුරු ප්‍රතිචාරය ඉහළ අගයක් ගනී. එහි a, b කොටස් දෙකකි. එහි අපේක්ෂක පහසුතාව a කොටසේ 95%ක් ද, b කොටසේ 81%ක් ද විය. කාලීන තොරතුරු පිළිබඳ සවිමත් බව ඊට හේතුවය. එහෙත් 100% කරා ළඟා නොවූයේ ප්‍රශ්නයේ ආකෘතිමය ස්වරූපයට අනුරූපව පිළිතුරු සැපයිමට අවධානය යොමු නොවූ හෙයිනි.

දෙවන කොටසේ පහසුතාව 64%කි. එය සතුටුදායක මට්ටමකි. එහෙත් අපේක්ෂකයන්ගෙන් 36%ක් අඩු පහසුතාව ලැබූයේ ප්‍රශ්නයේ සඳහන් "**වැඩි අවධානයක්**" යන වචන කාණ්ඩය කෙරෙහි අවධානය යොමු නොකිරීමත්, පාරිසරික ගැටලු තුළින් මතුවන අයහපත් බලපෑම් වලට පිළිතුර පටලවා ගැනීමත් නිසාය.

තෙවන කොටසේ පහසුතාව 71%ක් විය. එය විස්තරාත්මක පිළිතුරු දිය යුතු ප්‍රශ්නයකි. භාෂා භාවිතයේ හැකියාව බලපෑමෙන් 29%ක් අඩු පහසුතාව ලබා ඇත.

සමස්ත වැඩි පහසුතාව සෑම ප්‍රශ්න කොටසකදීම 60% ඉක්මවා ඇත. සාපේක්ෂව බැලූ විට අපේක්ෂකයින්ගේ ඉහළම නිවැරදි ප්‍රතිචාර ලැබූ ප්‍රශ්නයයි. වට ප්‍රස්තාරයට අනුව 6 - 10 ප්‍රාන්තරයේ අපේක්ෂක ප්‍රතිශතය 70%කි. අනෙක් ප්‍රශ්න වලට සාපේක්ෂව 0 - 2 ප්‍රාන්තරයේ 8%ක අඩුම අපේක්ෂක ප්‍රතිශතයකි.

සමස්ත සමාජයේම පවතින පාරිසරික අවධානය අපේක්ෂකයින් කෙරෙහිද බලපා ඇත. චරිතායනය කරගත් මෙම කරුණු ඇසුරෙන් ප්‍රශ්න පත්‍ර ආකෘතියට යොමු කරවීමට ගුරුභවතුන් සහාය විය යුතුය. පරිසරය කෙරෙහි හිතකර ආකල්ප වර්ධනය කරවීම කෙරෙහිද ගුරුවරුන්ගේ අවධානය යොමු විය යුතුය.

## **III** කොටස

### **3. පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා :**

#### 3.1 **පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු**

**පොදු උපදෙස්**

* ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා තේරුම් ගත යුතුය.
* හොඳින් කියවා නිරවුල් අවබෝධයකින් යුතුව ප්‍රශ්න තෝරා ගත යුතුය.
* II පත්‍රයේ පිළිතුරු සැපයීමේදී උපදෙස් හොඳින් කියවා බලා නියමිත ප්‍රශ්න සංඛ්‍යාවට පමණක් පිළිතුරු සැපයිය යුතුය.
* ප්‍රශ්න අංකය, අනුකොටස් හා අදාළ වෙනත් සංකේත නිවැරදිව භාවිත කරමින් පිළිතුරු සැපයිය යුතුය
* අත් අකුරු පැහැදිලිව ලිවිය යුතුය.
* අයදුම්කරුගේ විභාග අංකය නිවැරදිව හා පැහැදිලිව සෑම පිටුවකම සඳහන් කළ යුතුය.
* නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවල දීර්ඝ විස්තර නොකළ යුතුය.
* නිදසුන් ඇසුරින් විස්තර කිරීමේදී නිදසුන් ඇතුළත් කිරීම අනිවාර්ය විය යුතුය.
* පිළිතුරු ලිවීමේදී නිරතුරුව ප්‍රශ්නයට සම්බන්ධ වී පිළිතුරු සැපයිය යුතුය.
* පිළිතුරු ලිවීමේදී නිල් හා කලු පෑන් පමණක් භාවිත කළ යුතුය.

**විශේෂ උපදෙස්**

* I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයිය යුතු ශිල්පීය ක්‍රම **විවිධ** බව සැලකිල්ලට ගත යුතුය.
* විස්තරාත්මක පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න වලදී **කරුණු** හා **විස්තර කිරීමට** ලකුණු බර තැබෙන බව සැලකිය යුතුය.
* නිශ්චිත පිළිතුරු වලදී විෂයානුබද්ධ පාරිභාෂිත **වචනම** යොදා ගත යුතුය.
* පිළිතුරකින් කරුණු පැහැදිලි කිරීමේදී උචිත ලෙස ගොනු කර ඉදිරිපත් කළ යුතුය.
* පිළිතුරු සඳහා අපේක්ෂිත කරුණු සංඛ්‍යාව **පමණක්** ඉදිරිපත් කිරීම ගැන සැලකිලිමත් විය යුතුය.

## 3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් පිළිබඳ අදහස් හා යෝජනා

**අයදුම්කරුවන් සඳහා යෝජනා :**

* අදාළ පෙළපොත් පරිශීලනය කිරීම පිළිබඳ දැඩි අවධානයක් යොමු කළ යුතුය.
* දැනුම නිරන්තරයෙන්ම යාවත්කාලීන කර ගැනීම සඳහා බාහිර පොත්පත් හා සන්නිවේදන මාධ්‍ය කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය.
* නිරන්තරයෙන්ම ඒකක අවසානයේ අභ්‍යාසකරණය කළ යුතුය.
* පුරවැසි අධ්‍යාපනය හදාරන අයකු ලෙස සුවිශේෂී වීමට ආකල්ප හා චර්යාමය වෙනසක් ඇති කර ගැනීමට අවධානය යොමු විය යුතුය.

**ගුරුභවතුන් සඳහා යෝජනා :**

* ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා මනාව සූදානම් වීම වැදගත්ය.
* විෂය නිර්දේශය, ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය, පෙළපොත, බාහිර සම්පත් මූලාශ්‍ර පිළිබඳව මනාව දැනුවත් විය යුතුය.
* විෂය නිර්දේශය සම්පූර්ණයෙන්ම ආවරණය විය යුතුය.
* ක්‍රියාකාරී අත්දැකීම් ආශ්‍රිත නිර්මාණශීලී ඉගෙනුම් අවස්ථා සම්පාදනය කළ යුතුය.
* කාලීන තොරතුරු සිසුන්ට ලබා දිය යුතුය. ලබා ගැනීමටද යොමු කළ යුතුය.
* නිරන්තර අභ්‍යාසකරණයට සිසුන් යොමු කළ යුතුය.
* ප්‍රශ්න පත්‍රයේ ආකෘතිය හා අදාළව පිළිතුරු සැපයීමේ ශිල්පීය කුසලතා පිළිබඳව සිසුන් දැනුවත් කළ යුතුය.
* සිසුන්ගේ සාධන මට්ටම් පිළිබඳව විශේෂ අවධානයෙන් ඉගෙනුම් අවස්ථා සම්පාදනය කළ යුතුය.
* විෂයානුබද්ධ සේවාස්ථ සැසිවලට සහභාගී වෙමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද මෙන්ම දැනුමද යාවත්කාලීන කර ගත යුතුය.
* 'තමාද සමාජයේ අත්‍යවශ්‍ය පුද්ගලයෙකි' යන ආකල්පය සිසුන් තුළ වර්ධනය වන සේ ඉගැන්වීම සිදු කළ යුතුය.